# පාඨමාලා විස්තර සටහන 2026




**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය**

*ජාතීන්ගේ සංවර්ධනය උදෙසා සභාවට සම්පත්*

# කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

*ජාතීන්ගේ සංවර්තනය උදෙසා සභාවට සම්පත්*

# පාඨමාලා විස්තර සටහන
# 2026

ශ්‍රී ලංකාව තුළත් ඉන් ඔබ්බටත්, සභාව තුළ මෙන්ම වැඩපොළේද, සේවයේ නිරතව සිටින ඇදහිලිවතුන්, ක්‍රිස්තු ගුණැති නායකයින් වන පිණිස, දේවධාර්මික අධ්‍යාපනයක් තුළින් සන්නද්ධ කිරීමට, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය කැපවී සිටී.

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේදී, ඔබ විවිධ ක්‍රිස්තියානි නිකායන්වල ඇදහිලිවන්තයන් සමඟ එකට කටයුතු කරමින් ඉගෙන ගන්නා බැවින්, සියලු ක්‍රිස්තියානි සම්ප්‍රදයන් වල ඇති සාරවත්බව අත්දැකීමට ලැබෙන දේවධර්ම ශාස්ත්‍රාලයකි.

ක්‍රිස්තියානි එකමුතුකම කෙරෙහි කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ කැපවීම මුල් බැස ඇත්තේ ශුද්ධ ලියවිල්ලේ අධිකාරිය මතය. අප එකමුතු වන්නේ, බයිබලය අපගේ ඇදහිල්ල සහ ජීවිතය සඳහා එකම මාර්ගෝපදේශය බවට ඇති හවුල් විශ්වාසය වටාය.

එන්න, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ අධ්‍යාපන ලබන්නන්ගේ විචිත්‍ර ප්‍රජාවට එකතු වී, අධ්‍යාපනය, ආත්මික වර්ධනය සහ දේව සේවය සඳහා ඵලදායී නිපුණතා වර්ධනය කර ගැනීම පෙරදැරි කරගත් ආකර්ෂණීය ගමනක් අරඹන්න!

**1971 අංක 32 දරන ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ආඥා පනත මගින් සංස්ථාපිත**
**ආසියාතික දේවධර්ම සංගමයේ තෘතික අධ්‍යාපන ආයතනයක් ලෙස පිළිගත් (ATA)**
**කොළඹ බයිබල් විද්‍යාලයේ එකම අංශයයි.**
**ශ්‍රී ලංකා ජාතික ධර්මදූනි සන්ධානයේ හා (NCEASL)**
**ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සාමාජික (NCCSL)**

# සන්නිවේදන තොරතුරු

| | |
|---|---|
| **ලියාපදිංචි වීම** | registrar@cts.lk |
| **ශාස්ත්‍රීය වැඩසටහන්** | student.services@cts.lk |
| **ශිෂ්‍ය ගිණුම් කටයුතු** | student.accounts@cts.lk |
| **අධ්‍යයන ශිෂ්‍යත්ව** | scholarships@cts.lk |
| **පුස්තකාලය** | library@cts.lk |
| **තොරතුරු තාක්ෂණය** | it@cts.lk |
| **ප්‍රායෝගික සේවා පුහුණුව** | practicums@cts.lk |
| **උපදේශන වැඩසටහන්** | counselling@cts.lk |
| **ශාස්ත්‍රපති වැඩසටහන්** | ma@cts.lk |
| **ළමා සේවා ක්ෂේත්‍රය** | cm@cts.lk |
| **සහකාර පීඨාධිපති**<br>ජූලියන් දේවදසන් මහතා | julian@cts.lk |
| **පීඨාධිපති**<br>දේවගැති රවින් කල්දේරා | ravin@cts.lk |

**+94 11 2890809 | www.cts.lk**

# පටුන

| | |
|---|---|
| | *පිටු අංකය* |
| **පොදු තොරතුරු** | 4 |
| **1 වාරය: ජනවාරි-අප්‍රේල්** | |
| කාල සටහන | 6 |
| උදෑසන සහ දහවල් පැවැත්වෙන පාඨමාලා | 7 – 9 |
| සවස පැවැත්වෙන පාඨමාලා | 10 – 11 |
| දේවධර්ම උපාධි සම්මන්ත්‍රණ | 12 |
| **2 වාරය: මැයි-අගෝස්තු** | |
| කාල සටහන | 14 |
| උදෑසන සහ දහවල් පැවැත්වෙන පාඨමාලා | 15 – 17 |
| සවස පැවැත්වෙන පාඨමාලා | 17 – 18 |
| සෙනසුරාදා පැවැත්වෙන පාඨමාලා | 19 |
| දේවධර්ම උපාධි සම්මන්ත්‍රණ | 19 – 20 |
| **3 වාරය: අගෝස්තු-නොවැම්බර්** | |
| කාල සටහන | 22 |
| උදෑසන සහ දහවල් පැවැත්වෙන පාඨමාලා | 23 – 25 |
| සවස පැවැත්වෙන පාඨමාලා | 25 – 27 |
| දේවධර්ම උපාධි සම්මන්ත්‍රණ | 27 |
| **උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේ පැවැත්වෙන පාඨමාලා** | 28 |
| **කථිකාචාර්යවරුන්ගේ විස්තර** | 29 – 34 |
| **CTS පාඨමාලා විස්තර** | 35 |
| **ළමා සේවා ක්ෂේත්‍රය** | 36 |

# පොදු තොරතුරු

**<u>CTS පාඨමාලා:</u>**

- CTS නියමානුකූල පාඨමාලාවක් සාමාන්‍යයෙන් පවත්වන්නේ සතියකට පන්තියක් බැගින් සති 13ක කාලයක් පුරාය.
- කෙටිකාලීන පාඨමාලා සම්පූර්ණ දින 4ක් පුරා පැවැත්වෙන කඩිනම් අධ්‍යයන පාඨමාලා වේ.
- බොහෝ පාඨමාලාවන්හි පන්තිය තුළ ගත කරන කාලයේ එකතුව පැය 30ක් වුවත් ඇතැම් ඒවායේ පැය 45ක මුළු එකතුවක් තිබිය හැකිය. එසේ නැතහොත් පැය 30ක පන්ති කාමර කාලයක්ද පැය 15ක ප්‍රායෝගික ක්‍රියාකාරකම් කාලයක්ද ඇත.

**<u>පාඨමාලා දේශන පැවැත්වීම:</u>**

- **පන්ති කාමරය තුළ:** පාඨමාලාව CTS කොහුවල පරිශ්‍රයේදී හෝ උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේ ඉගැන්වේ.
- **අන්තර්ජාලය හරහා:** පාඨමාලාව Zoom හරහා ඉගැන්වෙන අතර අදාළ සටහන් Moodle තුළින් ලබා ගත හැකිය. ඔබට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවක් හා ඩිජිටල් උපාංගයක් අවශ්‍ය වනු ඇත.
- **මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය:** පාඨමාලාව පන්ති කාමරය තුළ හා අන්තර්ජාලය හරහා ඉගැන්වේ. ඇතැම් සතිවල ඔබගේ පන්තිය CTS කොහුවල පරිශ්‍රයේදී පැවැත්වෙන අතර අනෙක් සතිවල අන්තර්ජාලය හරහා ඉගැන්වෙනු ඇත. සැලැස්ම පිළිබඳ ඔබගේ කථිකාචාර්යවරයා පාඨමාලාව ආරම්භයේදී ඔබට දැනුම් දෙනු ඇත.

**<u>CTS පාඨමාලා ගාස්තු:</u>**

පාඨමාලාවක් හඳුන්වාදීමේ ගාස්තුව රු. 7500/- කි.

** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා සහනදායි මිලකට සිසුන්ට සැපයීමට හැකිව ඇත්තේ එය සේවයේ මිතුරන්ගේ නොමසුරු මූල්‍ය පරිත්‍යාගශීලීත්වය නිසා බැව් අපි කෘතඥතා පූර්වකව සිහිපත් කරමු. මෙම සුවිශේෂී සැපයුමේ යහපත් ගබඩාකරුවන් වීම සිසුන්ගෙන් අපේක්ෂා කෙරේ.*

**<u>පාඨමාලා සඳහා CTSහි ලියාපදිංචි වන ආකාරය:</u>**

ලියාපදිංචි වීමේ අයදුම් පත registration.cts.lk සම්පූර්ණ කරන්න. ගෙවීම් අන්තර්ජාලය හරහා https://www.cts.lk/payment/, බැංකු හුවමාරු තුළින්, හෝ ක්‍රෙඩිට් කාඩ් තුළින් කළ හැකිය.
***සැලකිය යුතුයි:*** *පන්තියක ඔබගේ ස්ථානය වෙන්කරනු ලබන්නේ ඔබ පාඨමාලාව සඳහා සම්පූර්ණ ගෙවීම කළ පසුවය.*

**වැදගත්:** පළමු වරට පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වන්නන්
ඔබගේ සභාපාලකතුමාගෙන් නිර්දේශ ලිපියක් රැගෙන ආ යුතුය.

**<u>ලියාපදිංචි විය හැකි දින හා වේලාවන්:</u>**

යම් වාරයක පාඨමාලා සඳහා ලියාපදිංචි විය හැක්කේ එම වාරය ආරම්භ වන දින දක්වා පමණි.

***පළමු වාරය: 2026 ජනවාරි 5***
***දෙවන වාරය: 2026 මැයි 5***
***තෙවන වාරය: 2026 අගෝස්තු 31***

# 1 වාරය

# 2026 ජනවාරි 5 - අප්‍රේල් 4

○ පන්ති කාමරය තුළ | □ අන්තර්ජාලය හරහා | ★ මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

# කාල සටහන - 1 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| උදෑසන | ○ **ආත්මික සංග්‍රාමය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:45<br>විමලසේන ජයලත් | ○ **බයිබලීය අර්ථ විග්‍රහය**<br>පෙ.ව.9:00-පෙ.ව.12:30<br>රවින් කල්දේරා | ○ **ආමොස් පොත**<br>පෙ.ව.9:00-ප.ව.12:45<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ○ **දැඩි කම්පනයට පත් දරුවන්ට සුවය සහ නව බලාපොරොත්තුව**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>ක්‍රිස්නි එදිරිසිංහ | ○ **ප්‍රධාන දේවවේද සම්ප්‍රදායන් ගවේෂණය**<br>පෙ.ව.9:00-ප.ව.12:45<br>මනෝජ් පීරිස් \|<br>රවින් කල්දේරා |
| | | ○ **ලෝක ඉතිහාසයේ කිතුනු දායකත්වය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:20<br>ජී පී වී සෝමරත්න | ○ **වෙනත් ආගම් අදහන්නන් සමඟ සබඳතා පැවැත්වීම**<br>පෙ.ව.9:00-ප.ව.12:45<br>සුරංගික ප්‍රනාන්දු \|<br>දුලිප් ප්‍රනාන්දු<br>සහභාගිකමේ කාලය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | දේව මෙහෙය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ **කිතුනු දෙමාපියභාවය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>ක්‍රිස්නි එදිරිසිංහ |
| දහවල් | □ **නව ගිවිසුමේ පසුබිම**<br>ප.ව.3:00-ප.ව.5:30<br>බර්නාඩ් කොස්තා | ○ **නායකත්වයට මඟ: 1 සහ 2 තිමෝති**<br>ප.ව.3:00-ප.ව.5:20<br>ලසිත් රාජකරුණා | ○ **ක්‍රියා පොතේ ධර්මදූතය**<br>ප.ව.3:00-ප.ව.5:45<br>සුරංගික ප්‍රනාන්දු | ○ **බයිබලය අධ්‍යයන ක්‍රම**<br>ප.ව.3:00-ප.ව.5:30<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ○ **කිතුනු දැක්ම තුළ සන්නිවේදනය**<br>ප.ව.3:00-ප.ව.5:30<br>මධු මිහිරි ප්‍රනාන්දු |
| සවස | ★ **අන්තර්ජාල අවකාශය තුළ දේව සේවය**<br>ප.ව.6:00-ප.ව.8:30<br>සුරංග අතුකෝරාළ | □ **දෙවියන් වහන්සේ සහ ලෝකය**<br>ප.ව.6:00-ප.ව.8:20<br>සරත් ද සිල්වා | ★ **ධර්මදූත සේවයට හැඳින්වීමක්**<br>ප.ව.6:00-ප.ව.8:45<br>සනත් අතුකෝරාළ | ★ **සන්දර්භගත දේවවේද**<br>ප.ව.6:00-ප.ව.8:30<br>සමන් පෙරේරා | □ **ව්‍යාජ ආත්මික ප්‍රජාවිධි පිළිබඳව කටයුතු කිරීම**<br>ප.ව.6:00-ප.ව.8:30<br>සනත් අතුකෝරාළ |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

## 1 වන වාරය | 2026 ජනවාරි 5 - අප්‍රේල් 4

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### ආත්මික සංග්‍රාමය

‘අපගේ සටන මිනිස් සතුරන්ට විරුද්ධව නොවේ’ (එපීස 6:12). නපුරු ආත්ම සහ දුෂ්ට ආත්ම මහත් සේනා ගැන දේව වචනය දක්වා ඇත. කිතුනුවා සහ සභාව නිරන්තරයෙන්ම ආත්මික ගැටුමකට මැදිවී සිටියි. සාතන්ගේ සැලසුම් අබිබවා ජය ගැනීමට ඇවැසි දැනුම, සංග්‍රාමයේ ස්වභාවය තේරුම් ගැනීම සහ සන්නද්ධ වීම ආත්මික සංග්‍රාමය විෂයෙන් ලබාදේ.

**BTh|Dip වෛකල්පික**

සති 11

දිනය: සඳුදා

වේලාව: පෙ.ව.9:00-11:45

ආරම්භය: ජනවාරි 12

සම්මාන: 2

කථිකාචාර්ය: **විමලසේන ජයලත්**

### ලෝක ඉතිහාසයේ කිතුනු දායකත්වය

කිතු දහම ලෝක ඉතිහාසයට දැක්වූ දායකත්වයන් සුවිශාලය. අධ්‍යාපනය, සංගීතය, සමාජ ක්‍රියාකාරකම්, නීතිය, මිනිස් අයිතිවාසිකම්, ගෘහ නිර්මාණය ඇතුළු බොහෝ දේ සම්බන්ධව ලෝක ශිෂ්ටාචාරය කෙරෙහි කිතු දහමෙන් ලැබූ විවිධාකාර දායකත්වයන් මෙම පාඨමාලාවේදී විමසා බැලේ.

**BTh|Dip වෛකල්පික**

සති 13

දිනය: අඟහරුවාදා

වේලාව: පෙ.ව.9:00-11:20

ආරම්භය: ජනවාරි 6

සම්මාන: 2

කථිකාචාර්ය: **ජී පී වී සෝමරත්න**

### නායකත්වයට මඟ

*1 සහ 2 තිමෝති*

තිමෝතිගේ භූමිකාව දැරිය හැකි තරුණ නායකයන් සහ වගකීමක් ඇති විශ්වසනීය තරුණයකුගේ අවශ්‍යතාව දුටු පාවුල් අපොස්තුළුතුමා වැනි උපදේශකයන් වත්මන් සභාව තුළ සිටීම අවශ්‍ය වේ. 1 සහ 2 තිමෝති පොත ගැඹුරින් අධ්‍යයනය කිරීම තුළින් නායකත්වයේ ඉහළ තැන් ගැනීමටත් පරිණත කිතුනුවන්ට තරුණ නායකයන්ට උපදෙස් දීමටත් අභියෝග කරනු ඇත.

**BTh|Dip වෛකල්පික**

සති 13

දිනය: අඟහරුවාදා

වේලාව: ප.ව.3:00-5:20

ආරම්භය: ජනවාරි 6

සම්මාන: 2

කථිකාචාර්ය: **ලසිත් රාජකරුණා**

### ආමොස් පොත

අපගේ සමාජයේ පෙර නොවූ විරූ ලෙස දූෂණය, අසාධාරණය සහ ප්‍රචණ්ඩත්වය දක්නට ලැබේ. දෙවියන් වහන්සේට හිමි ගෞරවය ලැබෙන ලෙස සමාජය පරිවර්තනය පිණිස අප කෙසේ ප්‍රතිචාර දැක්විය යුතුද? ආමොස් පොත විස්මය ජනක ලෙස කාලීන වැදගත්කමක් ඇති හෙයින් කිතුනුවන්ට ප්‍රයෝජනවත් බයිබලීය පොතකි.

**BTh|Dip වෛකල්පික**

සති 11

දිනය: බදාදා

වේලාව: පෙ.ව.9:00-ප.ව.12:45

ආරම්භය: ජනවාරි 7

සම්මාන: 2

කථිකාචාර්ය: **ඊන්සිටීන් ප්‍රනාන්දු**

1 වන වාරය | 2026 ජනවාරි 5 - අප්‍රේල් 4

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### වෙනත් ආගම් අදහන්නන් සමඟ සබඳතා පැවැත්වීම

ප්‍රධාන ආගම් තුනකින් යුත් සමාජයක බලපෑමක් සහිතව ජීවත්වීම සඳහා කිතුනුවන්ට මෙම ආගම් සහ ඔවුන්ගේ සුවිශේෂී සංස්කෘතික ලක්ෂණ ගැන ගැඹුරු අවබෝධයක් තිබීම වැදගත් වේ. බෞද්ධ, හින්දු, මුස්ලිම් ආගම්වල මූලික සිද්ධාන්ත ඉගෙනීමටත් ඔවුන් සමග ගෞරවනීය සංවාදයකට එළඹීමටත් ඉගෙන ගත හැකිය. සමාදන වූ ශ්‍රී ලංකාවක් තුළ ඔබගේ කාර්යභාරය කුමක්ද? එන්න පැමිණ ගවේෂණය කරන්න.

BTh|Dip වෛකල්පික
Evan අනිවාර්ය

සති 11

දිනය: බදාදා

වේලාව: පෙ.ව.9:00-ප.ව.12:45

ආරම්භය: ජනවාරි 7

සම්මාන: 2

කථිකාචාර්ය: **සුරංගික ප්‍රනාන්දු | දූලිප් ප්‍රනාන්දු**

### ක්‍රියා පොතේ ධර්මදානය

ක්‍රිස්තුස් වහන්සේගේ මුල් අනුගාමිකයින් එවැන්ජලිස්ත සේවයේ නියැලී සිටින විට, ශුද්ධාත්මයාණන්ගේ බලවත් බලය අපිද අත්දකිමු. බොහෝ දුක් වේදනා මධ්‍යයේ වුවද, ඔවුහු ස්වාමීන් වහන්සේගේ මරණය සහ උත්ථානය පිළිබඳ පණිවිඩය බෙදගත් අතර, පෞද්ගලිකව, කුඩා හා විශාල කණ්ඩායම් වශයෙන් දීප්තිමත් සාක්ෂිකරුවෝ වූහ. ඔවුන් ප්‍රථමවරට සභා රෝපණය කළහ. ශුද්ධ ලියවිල්ල හරහා එවැන්ජලිස්ත සේවය සඳහා ඔබගේ ජ්වලිතකම දැල්වීමට කැමති අයට අත්‍යවශ්‍ය පන්තියකි.

BTh|Dip අනිවාර්ය
Evan වෛකල්පික

සති 11

දිනය: බදාදා

වේලාව: ප.ව.3:00-5:45

ආරම්භය: ජනවාරි 7

සම්මාන: 2

කථිකාචාර්ය: **සුරංගික ප්‍රනාන්දු**

### දැඩි කම්පනයට පත් දරුවන්ට සුවය සහ නව බලාපොරොත්තුව

වර්තමාන වාර්තාවලට අනුව ලංකාවේ ළමුන් පෙර නොවූ විරූ අයුරින් කම්පනයට හා චිත්තවේගයන්ට පත්වී ඇත. කොළඹින් පිටත අසන නඩුවලින් වැඩි ප්‍රමාණයක් ළමා අපයෝජන සම්බන්ධවය. ශාරීරික, මානසික සහ ලිංගික අතවරයන්ට මුහුණ දුන් ළමුන් හට සේවය කිරීම සඳහා ඔබ සන්නද්ධ කරයි.

BTh|Dip වෛකල්පික

සති 12

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: ජනවාරි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **ක්‍රිස්නි එදිරිසිංහ**

### බයිබලය අධ්‍යයන ක්‍රම

ස්වයං-බයිබල් අධ්‍යයනයට මහෝපකාරී පාඨමාලාවකි. මෙම පාඨමාලාව තුළින් අධ්‍යාපනයට අදාළ ප්‍රශ්න ඇසීමටත් ජීවිතයට අදාළ කර ගැනීමටත් පුරුදු පුහුණු කරනු ඇත. බයිබලය අධ්‍යයනය කරන ක්‍රම හයක් සහ බයිබලය අධ්‍යයනයට ඇවැසි මෙවලම් ගැන උගනුමට මං පාදයි.

BTh|Dip අනිවාර්ය

සති 12

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව.3:00-5:30

ආරම්භය: ජනවාරි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **ඒන්ස්ටීන් ප්‍රනාන්දු**

**1 වන වාරය | 2026 ජනවාරි 5 - අප්‍රේල් 4**

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### කිතුනු දෙමාපියභාවය

BTh|Dip වෛකල්පික

බයිබලය තුළින් දෙමව්පියෙකු ලෙස දෙවියන් වහන්සේ දක්වන ආකාරයද ඇතිදැඩි කිරීම සම්බන්ධව එහි ඉගැන්වීම් ද මෙම පාඨමාලාවේදී සොයා බලනු ලැබේ. පෝෂණය, ආරක්ෂාව, විනය, උපදෙස් යනාදිය දරුවෙකුගේ වර්ධනයේ සෑම අවධියකදීම දෙමාපිය ආදරය තුළ තිබිය යුතුය. වඩා හොඳ දෙමාපියන් වීමට ඔබටත් ඒ සඳහා අන්‍යයන්ට මග පෙන්වීමටත් මේ පාඨමාලාව හැදෑරීම තුළින් හැකියාව ලැබේ.

සති 12

දිනය: සිකුරාද

වේලාව: පෙ.ව.9:00-11:30

ආරම්භය: ජනවාරි 9

සම්මාන: 2

කථිකාචාර්ය: **ක්‍රිස්නි එදිරිසිංහ**

### කිතුනු දැක්ම තුළ සන්නිවේදනය

BTh|Dip වෛකල්පික

මිනිසා සමග සන්නිවේදනය කරන්නාවූ දෙවියන් වහන්සේ නමස්කාර කරන කිතුනුවන් වූ අපි සන්නිවේදන කලාවේ ඉදිරියෙන්ම සිටිය යුතු වෙමු. මිනිසා මුහුණ දෙන ප්‍රශ්න වලට මූලික හේතුවක් වනුයේ දුර්වල සන්නිවේදනයයි. ඔබගේ වෘත්තියේදී ඉවැන්ජලිස්ත සේවයේ දී පුද්ගලික ජීවිතයේ සියලු සම්බන්ධතාවයන්වලදී වැදගත් වූ සන්නිවේදනයේ කුසලතා වර්ධනය කර ගැනීමට මෙම පාඨමාලාව උපකාරී වේ.

සති 12

දිනය: සිකුරාද

වේලාව: ප.ව.3:00-5:30

ආරම්භය: ජනවාරි 9

සම්මාන: 2

කථිකාචාර්ය: **මධු මිහිරි ප්‍රනාන්දු**

**1 වන වාරය | 2026 ජනවාරි 5 - අප්‍රේල් 4**

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## අන්තර්ජාලය හරහා

### නව ගිවිසුමේ පසුබිම

BTh|Dip අනිවාර්ය

ක්‍රිස්තුස් වහන්සේ හා අපොස්තුළුවරුන්ගේ ලෝකය හැඩගැස්වූ සුවිශේෂී සිද්ධි හා ව්‍යාපාර පිළිබඳ අන්තර් දෘෂ්ටියක් මෙම පාඨමාලාව තුළින් ලැබේ. අන්තර් ගිවිසුම් යුගයේ ජුදෙව් ආගම, එහි වැදගත් ප්‍රගමනයන්, වැදගත් ලිපි ලේඛන ගැන මෙන්ම පලස්තීනයේ සහ රෝම ලෝකයේ සංස්කෘතිය ගැනද මෙහිදී විමසා බැලේ.

සති 12

දිනය: සඳුද

වේලාව: ප.ව.3:00-5:30

ආරම්භය: ජනවාරි 5

සම්මාන: 2

කථිකාචාර්ය: **බර්නාඩ් කොස්තා**

## 1 වන වාරය | 2026 ජනවාරි 5 - අප්‍රේල් 4

# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

### අන්තර්ජාල අවකාශය තුළ දේව සේවය

අන්තර්ජාල අවකාශය වනාහි කිතුනු අධ්‍යාත්මිකත්වයට හා සේවයට බාධාවක් සේ සැලකේ. එහෙත් අන්තර්ජාලය භාවිතයෙන් ලොව සීමාන්තය දක්වා ම දේව වචනයෙන් හා සේවයෙන් මෙහෙවර කළ හැකි ය. දේව සේවය හා මෙහෙවර සඳහා ඇති අවස්ථාවන් සඳහා අන්තර්ජාල අවශකාශය භාවිතයට ගන්නේ කෙසේදැයි මෙම පාඨමාලාවෙන් සාකච්ඡා කෙරේ.

**BTh|Dip වෛකල්පික**

සති 12

දිනය: සඳුදා

වේලාව: ප.ව.6:00-8:30

ආරම්භය: ජනවාරි 5

සම්මාන: 2

කථිකාචාර්ය: **සුරංග අතුකෝරාළ**

### ධර්මදූත සේවයට හැඳින්වීමක්

“දූතනය” සෑම කිතුනුවෙකුම අසා ඇති වචනයක් වුවද ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොපවතියි. මෙම පාඨමාලාව ඔබ දූතනයේ විවිධ පැතිකඩ තුළින් ගෙන යන අතර දෙවියන් වහන්සේගේ දූතනය තුළ ඔබටත්, සභාවටත් ඇති සුවිශේෂ කාර්යභාරය විවිධ මං ඔස්සේ අභියෝගාත්මක ලෙස ඉටුකිරීමට ඔබ සූදනම් කරයි.

**BTh|Dip අනිවාර්ය**

සති 11

දිනය: බදාදා

වේලාව: ප.ව.6:00-8:45

ආරම්භය: ජනවාරි 7

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අත්කෝරාළ**

### සන්දර්භගත දේවවේද

සාම්ප්‍රදායික දේවධාර්මික ප්‍රවේශයන්ගෙන් වෙනස් වූ, කිතුනු දේවධර්මයේ සන්දර්භිය ප්‍රකාශයන් පිළිබඳ අවබෝධයක් මෙම පාඨමාලාව තුළින් ගෙනේ. දේවධර්මය නිරන්තරයෙන් සන්දර්භය මඟින් හැඩගැස්වෙන බැවින්, මානව වේදනාවන් හා සමාජ ගැටුම්වලින් පැන නැගුණු දේවධාර්මික ප්‍රගමනයන් පිළිබඳ පුළුල් ගවේශනයක් කෙරේ.

**BTh අනිවාර්ය**
**Dip වෛකල්පික**

සති 12

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව.6:00-8:30

ආරම්භය: ජනවාරි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **සමන් පෙරේරා**

# 1 වන වාරය | 2026 ජනවාරි 5 - අප්‍රේල් 4
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## අන්තර්ජාලය හරහා

| දෙවියන් වහන්සේ සහ ලෝකය | BTh\|Dip අනිවාර්ය |
|---|---|
| දෙවියන් වහන්සේගේ ස්වභාවය හා ගුණාංග, මවන ලද ලෝකය, මනුෂ්‍යත්වය හා පාපයට වැටීම, යන මූලික මාතෘකා වෙත අවධානය යොමු වේ. ක්‍රමික දේවධර්මය විෂය මාලාවේ පළමු අදියරයි. බයිබලීය පදනම මුල් කරගෙන, කිතුනු චින්තන ඉතිහාසයෙන් හා සමකාලීන සංවාදයන්ද ආශ්‍රිතව අධ්‍යයනය කරනු ලැබේ. | සති 13<br>දිනය: අඟහරුවාදා<br>වේලාව: ප.ව.6:00-8:20<br>ආරම්භය: ජනවාරි 6<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **සරත් ද සිල්වා** |

| ව්‍යාජ ආත්මික ප්‍රජාවිධි පිළිබඳව කටයුතු කිරීම | BTh\|Dip වෛකල්පික |
|---|---|
| "එවිට ඔව්හු සත්‍යයට කන්නොදී මිථ්‍යා ප්‍රබන්ධවලට හැරෙන්නේය" (2 තිමෝති 4). කිතුදහමේ ආරම්භයේ පටන්ම මිනිසුන්ගේ හිතෛෂිභාවය ප්‍රයෝජනයට ගෙන ඔවුන් නොමඟ යැවූ ඉගැන්වීම් නිසා බාධා ඇතිවිය. මෑත කාලයේ සෑම මහද්වීපයකම ව්‍යාජ ආත්මිකත්වයන් ජනකාන්ත ලෙස ප්‍රචලිත වී ඇත. මෙම පාඨමාලාව මගින් වැරදි ඉගැන්වීම් නිසා නොමඟ යන්නන් හට උපකාර කිරීමට ඔබට අත්වැලක් සපයයි. | සති 12<br>දිනය: සිකුරාදා<br>වේලාව: ප.ව.6:00-8:30<br>ආරම්භය: ජනවාරි 9<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **සනත් අත්කෝරාළ** |

# 1 වන වාරය | 2026 ජනවාරි 5 - අප්‍රේල් 4

# දේවධර්ම උපාධි සම්මන්ත්‍රණ

## පන්ති කාමරය තුළ

මෙම සම්මන්ත්‍රණ සකසා ඇත්තේ උපාධිය හෝ ශාස්ත්‍රපති වැඩසටහන්වලට ලියාපදිංචි වූ අය සඳහාය. පංති කාමරයක වැනි සැකැස්ම දේශනයක් හා සම්මන්ත්‍රණයක් අමතර සමබරතාවය ඇත. අමතර කියවීම් හා පර්යේෂණ මත පදනම්ව සිසුන් සාකච්ඡා සඳහා පත්‍රිකා සකස් කළ යුතුය.

උපාධි පාඨමාලාවේ ලියාපදිංචිය හා සම්මාන 60 සම්පූර්ණ කර තිබීම පූර්ව අවශ්‍යතාවන්ය.

### බයිබලීය අර්ථ විග්‍රහය

බයිබලය විචාරාත්මකව බැලීමේ විවිධ ක්‍රම ගැන සහ එහි විවිධ සාහිත්‍ය වර්ගයන් ගැන හැදෑරූ ශිෂ්‍යයා මෙම වැඩමුළුව තුළින් දේව වචනයේ නිධන්ගත දේ බැලීමටත්, විද්වතකු ලෙස බයිබලය හදාරා අර්ථ විග්‍රහ කිරීමටත් ඉගෙනීම ලබනු ඇත. බයිබලය අර්ථ විග්‍රහය කිරීමේදී අදාළ වන විචාරයන් පිළිබඳ කුසලතාවන් ගෙනේ.

**BTh අනිවාර්ය**

සති 13

දිනය: අඟහරුවාද

වේලාව: පෙ.ව.9:00-ප.ව.12:30

ආරම්භය: ජනවාරි 6

සම්මාන: 3

කථිකාචාර්ය: **රවින් කල්දේරා**

### ප්‍රධාන දේවවේද සම්ප්‍රදයන් ගවේෂණය

ස්වතන්ත්‍රවාදී දේවධර්මය හා විමුක්තිය අතර වෙනස කුමක්ද? ධර්මදනී සම්ප්‍රදයේ විශේෂාංග මොනවාද? රෙපරමාදු දේවධර්මයේ පදනම් මොනවාද? කිතුනු නිකායන් බොහෝ විට දේවධාර්මික සම්ප්‍රදයන් මත පිහිටුවා ඇති අතර නිකාය භේදයටද හේතුවී ඇත. සෑම ප්‍රධාන දේවධර්ම සම්ප්‍රදයකම මූලාරම්භය ව්‍යාප්තිය හා නියෝජිත දේවධර්මවේදීන් පිළිබඳ සොයා දැනගැනීමටත්, එක් එක් සම්ප්‍රදයේ සාධනීය හා නිෂේධනීය පැතිකඩයන් ඇගැයීමටත් ශිෂ්‍යයන්ට අවස්ථාව ලැබෙනු ඇත.

**BTh අනිවාර්ය**

සති 12

දිනය: සිකුරාද

වේලාව: පෙ.ව.9:00-ප.ව.12:45

ආරම්භය: ජනවාරි 9

සම්මාන: 3

කථිකාචාර්ය: **මනෝජ් පීරිස් | රවින් කල්දේරා**

# 2 වාරය
# 2026 මැයි 4 - අගෝස්තු 31

○ පන්ති කාමරය තුළ | □ අන්තර්ජාලය හරහා | ★ මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

# කාල සටහන - 2 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා | සෙනසුරාදා |
|---|---|---|---|---|---|---|
| උදෑසන | ○ **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය I**<br>පෙ.ව.9:00-පෙ.ව.11:45<br>ජී පී වී සෝමරත්න \| මධු මිහිරි ප්‍රනාන්දු | ○ **නායකත්වයේ ආකෘති**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>රවින් කල්දේරා | ○ **දේව වචනය පිළිබඳ සංකල්ප**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>සනත් අතුකෝරාළ<br>සහභාගිකමේ කාලය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ **ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලත්වය සහ කාර්යය**<br>පෙ.ව.9:00-ප.ව.12:20<br>රවින් කල්දේරා<br>දේව මෙහෙය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | □ **සමකාලීන මතවාද**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>සනත් අතුකෝරාළ \| මනෝජ් පීරිස්<br>○ **එපිසවරුන්ට යැවූ හසුන**<br>පෙ.ව.9:00-පෙ.ව.11:20<br>සනත් අතුකෝරාළ | ○ **බිඳුණු හදට සුවය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>පත්මසිලි ගුණතිලක |
| දහවල් | ○ **දේව සේවයේ ඇති අවධානම් හා උගුල්**<br>ප.ව.3:00-ප.ව.5:30<br>විමලසේන ජයලත් | ○ **සංවාදය සහ භක්තිසංරක්ෂණවේදය**<br>ප.ව.3:00-ප.ව.5:20<br>ලසිත් රාජකරුණා | ○ **ප්‍රඥා සාහිත්‍යය**<br>ප.ව.3:00-ප.ව.5:30<br>නාමල් වීරසිංහ | ○ **නිරෝගී විවාහයක් සඳහා උපදේශනය**<br>ප.ව.3:00-ප.ව.5:20<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ○ **ලිංගිකත්වය සහ විවාහය පිළිබඳ සාරධර්ම**<br>ප.ව.3:00-ප.ව.5:20<br>දුලිප් ප්‍රනාන්දු | |
| සවස | □ **නව ගිවිසුමට හැඳින්වීමක්**<br>ප.ව.6:00-ප.ව.8:30<br>බර්නාඩ් කොස්තා | □ **උත්පත්ති පොත**<br>ප.ව.6:00-ප.ව.8:20<br>රවින් කල්දේරා | ○ **ලොවට පියෙක් අවශ්‍යයි**<br>ප.ව.6:00-ප.ව.8:30<br>නිරෝෂන් පෙරේරා \| ක්‍රිස්නි එදිරිසිංහ | ★ **ශ්‍රාවකත්වය**<br>ප.ව.6:00-ප.ව.8:20<br>සරත් ද සිල්වා | ★ **කිතුනු ආත්මිකතාව**<br>ප.ව.6:00-ප.ව.8:20<br>මිශෙල් පීරිස් | |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

2 වන වාරය | 2026 මැයි 4 - අගෝස්තු 31

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය I

*ආරම්භයේ සිට ප්‍රතිසංස්කරණය දක්වා*

ක්‍රිස්තියානි සභාව ආරම්භයේ පටන් ප්‍රතිසංස්කරණය දක්වා කාලය අතරතුර මිනිසුන්ගෙන්ද සිද්ධීන්ගෙන්ද දේවධර්මයන්ගෙන්ද පෝෂණය වී හැඩ ගැසී පැමිණ ඇත. සභාවේ මුල් වසර 1400 තුළ බිහි වූ ප්‍රාණපරිත්‍යාගිවරු, තපස්වරු, ධර්මදූතයෝ සහ ප්‍රගමන මෙම අධ්‍යයනයේ දී ඔබට මුණගැසෙනු ඇත.

**BTh | Dip අනිවාර්ය**

සති 11

දිනය: සඳුද

වේලාව: පෙ.ව.9:00-11:45

ආරම්භය: මැයි 11

සම්මාන: 2

කථිකාචාර්ය: **ජී පී වී සෝමරත්න | මධු මිහිරි ප්‍රනාන්දු**

### දේව සේවයේ ඇති අවධානම් හා උගුල්

සමහර දේව සේවකයන්ගේ අනවධානය හා අනවබෝධය නිසා සේවා දිවියේ අවදානම් හා උගුල්වලට හසු වී ස්වකීය සේවය, ඇදහිල්ල, චරිතය හා විටෙක ජීවිතය පවා විනාශ කර ගනියි. මෙම පාඨමාලාව තුළින් ඔබ දේව සේවයේ නියැළෙන විට මුහුණ දිය හැකි අන්තරාකාරී තත්වයන් හා ඔබ උගුල් පිළිබඳ අවබෝධයක් හා එවායින් ප්‍රවේශම් වන්නේ කෙසේදැයි අවබෝධයක් ගෙනේ.

**BTh | Dip වෛකල්පික**

සති 12

දිනය: සඳුද

වේලාව: ප.ව.3:00-5:30

ආරම්භය: මැයි 4

සම්මාන: 2

කථිකාචාර්ය: **විමලසේන ජයලත්**

### සංවාදය සහ භක්තිසංරක්ෂණවේදය

ක්‍රිස්තියානි සංවාදය සහ භක්තිසංරක්ෂණවේදය ඔබට ක්‍රිස්තියානි ඇදහිල්ලේ සත්‍යයන් තාර්කිකව ආරක්ෂා කරන්න ඉගෙන ගන්නා ආකාරය උගන්වයි. මෙම පාඨමාලාව මෙම ක්ෂේත්‍රයේ ප්‍රධාන කරුණු හඳුන්වා දෙමින්, ක්‍රිස්තියානි දෘෂ්ටිය විශ්වාසයෙන් ආරක්ෂා කිරීමට පදනම දෙයි. එය ඇදහිලිකරුවන්ට සහ සොයන්නන්ට ක්‍රිස්තියානි ධර්මය ගැන ඇති අවංක ප්‍රශ්න සහ සැකයන්ට සරලව පිළිතුරු දීමට ඔබව සූදානම් කරයි.

**BTh | Dip වෛකල්පික**

සති 13

දිනය: අඟහරුවාද

වේලාව: ප.ව.3:00-5:20

ආරම්භය: මැයි 5

සම්මාන: 2

කථිකාචාර්ය: **ලසිත් රාජකරුණා**

### දේව වචනය පිළිබඳ සංකල්ප

මෙම පාඨමාලාව බයිබලයේ ගුණාංගයන් ගැන බොහෝ ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. දේව වචනය අපට ලැබුණේ කෙසේද? එහි කතුවරයන්ගේ පෞද්ගලිකත්වය සහ උත්සාහය දෙවියන් වහන්සේ යටපත් කළේද? බයිබලයේ නිරවද්‍යභාවයෙන් අදහස් වන්නේ කුමක්ද? දෙවියන් වහන්සේගේ එළිදරව්ව තුළ ආත්ම අවබෝධයටත්, සිත සැනසීමේදීත්, ඉගැන්වීමේදී සහ දේශනා කිරීමේදීත් බයිබලය භාවිත කිරීම ඉතා ප්‍රයෝජනවත් වේ.

**BTh | Dip වෛකල්පික**

සති 12

දිනය: බදාද

වේලාව: පෙ.ව.9:00-ප.ව.12:30

ආරම්භය: මැයි 6

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

## 2 වන වාරය | 2026 මැයි 4 - අගෝස්තු 31

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### ප්‍රඥා සාහිත්‍යය

ඉශ්රායෙල් ජන ජීවිතය තුළ පැවති සම්ප්‍රදායන් සතරකි. ඒ සම්ප්‍රදායන් නම්, රාජ්‍යත්වය, පූජකත්වය, දිවැසිවර, හා ප්‍රඥා ලෙසින් ය. ඉශ්රායෙලයේ ප්‍රඥාවන්තයාගේ භූමිකාව ප්‍රකට වන්නේ ප්‍රඥා සාහිත්‍ය සේ පොදුවේ සැලකෙන, යෝබ්, හිතෝපදේශ හා දේශනාකාරයා යන කෘතීන්ගෙන් ය. මෙම පාඨමාලාව තුළින් ඉශ්රායෙල් ප්‍රඥා සාහිත්‍යයත් එයින් මතුවන සභාවට වැදගත්වන අදාළ කිරීම් ගැඹුරින් සාකච්ඡා කෙරේ.

**BTh|Dip වෛකල්පික**

සති 12

දිනය: බදාදා

වේලාව: ප.ව.3:00-5:30

ආරම්භය: මැයි 6

සම්මාන: 2

කථිකාචාර්ය: **නාමල් වීරසිංහ**

### ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලත්වය සහ කාර්යය

ජේසුස් වහන්සේගේ දේවත්වය හා මනුෂ්‍යත්වය පිළිබඳ උන්වහන්සේගේ පුද්ගලත්වය විග්‍රහ කිරීමට කිතුනු ශාසනය තුළ විශේෂ කුතුහලයක් හා සියවස් ගණනාවක් පුරා පැවත එන සංවාදයක් ඇත. ජේසුස් වහන්සේ පැමිණියේ කුමක් ඉටු කිරීමටද? මිනිසාගේ ගැළවීමට උන්වහන්සේගේ මරණය හා උත්ථානය වැදගත් වන්නේ කෙසේද? මෙම පාඨමාලාව තුළ ක්‍රිස්තුවේදය සහ විමුක්තිවේදය ගවේෂණයට ලක් කරනු ඇත.

**BTh|Dip අනිවාර්ය**

සති 13

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: පෙ.ව.9:00-ප.ව.12:20

ආරම්භය: මැයි 7

සම්මාන: 2

කථිකාචාර්ය: **රවින් කල්දේරා**

### නිරෝගී විවාහයක් සඳහා උපදේශනය

විවාහකයන් පෙර නොදුටුවිරූ අභියෝගවලට වත්මනේ මුහුණ දෙයි. අවශ්‍ය උපකාර ලබාගත නොහැකිව බොහෝ දෙනා ප්‍රශ්නවලට මැදිවී සිටිති. උපදේශන කුසලතා සහිත සංවේදීවූත්, පරිණතවූත් සේවක සේවිකාවන්ගේ කාලීන අවශ්‍යතාවක් සභාවට ඇත. එම සේවය තුළින් විවාහකයන් සාර්ථක පවුල් ජීවිතයක් කරා සූදනම් කිරීම හා උපදේශනය සඳහා මගපෙන්වන්නකි.

**BTh|Dip වෛකල්පික**

සති 13

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව.3:00-5:20

ආරම්භය: මැයි 7

සම්මාන: 2

කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු**

### එපිසවරුන්ට යැවූ හසුන

එපිසවරුන්ට පාවුල් තුමා ලියූ හසුන "පාවුල් තුමාගේ පරමසාරය" ලෙස හඳුන්වනු ලබන්නේ සාරාංශයක් ලෙස ගත්කල එමඟින් ක්‍රිස්තුස් වහන්සේ ඔහුට භාරදුන් ශුභාරංචියේ හරය දැක්වෙන නිසාය. එපීස පොත දෙස කරන්නා වූ මෙම නැවුම් බැලීම තුළ ගැළවීම, සභාව හා කිතුනු ජීවිතය කෙරෙහි වූ ඔබේ දැක්ම පරිනාමනයකට ලක්වනු ඇත.

**BTh|Dip වෛකල්පික**

සති 13

දිනය: සිකුරාදා

වේලාව: පෙ.ව.9:00-11:20

ආරම්භය: මැයි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු**

## 2 වන වාරය | 2026 මැයි 4 - අගෝස්තු 31

# උදෑසන, දහවල් සහ සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### ලිංගිකත්වය සහ විවාහය පිළිබඳ සාරධර්ම

දේව වචනයට අනුකූලව විවාහය සහ ලිංගිකත්වයට අදාළව මතුවන සදාචාරාත්මක ප්‍රශ්න සලකා බැලීමක් කෙරේ. මෙම පාඨමාලාවේ අරමුණ නම් පාපී ලොවේ වසන කිතුනුවාට අදාළ මෙම ප්‍රශ්න සලකා බැලීමයි. විවාහයට පෙර ඇසුර, විවාහය තුළ ක්‍රියාවන්, ලිංගික හැඩගැස්ම සහ සේවය තුළ ලිංග භේදය නිසා ඇතිවන ප්‍රශ්න විමර්ශනාත්මකව අධ්‍යයනය කෙරේ.

BTh|Dip වෛකල්පික

සති 13

දිනය: සිකුරාද

වේලාව: ප.ව.3:00-5:20

ආරම්භය: මැයි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **දුලිප් ප්‍රනාන්දු**

### ලොවට පියෙක් අවශ්‍යයි

නූතන සමාජ ව්‍යසනයක් වන්නේ පවුලෙහි පිය ආභාසය නොමැති වීම හෝ ඌනතාවය ය. පවුලක් තුළ දරුවන් මැනවින් වැඩිම සඳහා පිය භූමිකාව අතිශයින් වැදගත් වෙයි. කැසී කාර්ස්ටන් විසින් නිර්මාණය කරන ලද පාඨමාලාවක් තුළින් පවුලේ පියකු වීමේ ආකාරය මැනවින් මතු කරමින්, ස්වර්ගය පොළොවෙහි කිතුනු පවුලක් තුළින් නිර්මාණ කරන ආකාරය මේ පාඨමාලිවෙන් උගත හැකිය.

BTh|Dip වෛකල්පික

සති 12

දිනය: බදාද

වේලාව: ප.ව.6:00-8:30

ආරම්භය: මැයි 6

සම්මාන: 2

කථිකාචාර්ය: **නිරෝෂන් පෙරේරා | ක්‍රිස්නි එදිරිසිංහ**

## 2 වන වාරය | 2026 මැයි 4 - අගෝස්තු 31

# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## අන්තර්ජාලය හරහා

### නව ගිවිසුමට හැඳින්වීමක්

නව ගිවිසුමේ පොත් තෝරා ගත් ආකාරය හා ඒවා පිළියෙල කළ ආකාරය ඉගෙන ගත හැකිය. නව ගිවිසුමේ සෑම පොතකම අඩංගු ප්‍රධාන පණිවිඩය හා එහි කර්තෘත්වය, නව ගිවිසුමේ පොත් සභාවට පළමු වතාවට ලැබුණු විට සිදුවුණු දේ පිළිබඳ ගවේෂණය කළ හැකිය. නව ගිවිසුම් සාහිත්‍ය පිළිබඳ පුළුල් අවබෝධයක් මෙම පාඨමාලාවෙන් ඔබට ලැබේ.

BTh|Dip අනිවාර්ය

සති 12

දිනය: සඳුද

වේලාව: ප.ව.6:00-8:30

ආරම්භය: මැයි 4

සම්මාන: 2

කථිකාචාර්ය: **බර්නාඩ් කොස්තා**

## 2 වන වාරය | 2026 මැයි 4 - අගෝස්තු 31
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
### අන්තර්ජාලය හරහා

| | |
|---|---|
| **උත්පත්ති පොත**<br>පටන් ගැන්ම පිළිබඳ ගැඹුරු අධ්‍යයනයකි. උත්පත්ති පොතෙහි සංස්කෘතික සහ ඓතිහාසික පසුබිම තුළ විචාරණාත්මක ඉගැන්වීමක් ගෙනේ. විශ්වයේද මිනිසාගේ ද ඉශ්රායෙල් ජනතාවගේද පාපය සහ ගැළවීමේද ආරම්භය ලියා ඇති පොත ලියැවී ඇති පසුබිම එහි සැකැස්ම, තේමාවන් සහ පණිවිඩය විමර්ශනය කෙරේ. | **BTh අනිවාර්ය**<br>**Dip වෛකල්පික**<br>සති 13<br>දිනය: අඟහරුවාදා<br>වේලාව: ප.ව.6:00-8:20<br>ආරම්භය: මැයි 5<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **රවින් කල්දේරා** |


## 2 වන වාරය | 2026 මැයි 4 - අගෝස්තු 31
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

| | |
|---|---|
| **ශ්‍රාවකත්වය**<br>***21 වන සියවසේදී ජේසුස් වහන්සේගේ මාර්ගය අනුගමනය කරනුයේ කෙසේද?***<br>පළමු ශත වර්ෂය තුළ ශ්‍රාවකත්වය යන්නෙන් අදහස් වූයේ කුමක්දැයි ඉගෙන ගෙන එම ඉගැන්වීම් අද සමාජයේ අභියෝග ජයගැනීමට අදාළ කරගැනීමට උපකාරී වේ. ව්‍යාපාරික ලෝකය තුළ, දේශපාලනය තුළ, දූත මෙහෙයන් තුළ ඇති ශ්‍රාවකත්වය පිළිබඳ විප්ලවකාරී ආකෘති හැදෑරීමක් ද සිදුවනු ඇත. | **BTh\|Dip අනිවාර්ය**<br>සති 13<br>දිනය: බ්‍රහස්පතින්දා<br>වේලාව: ප.ව.6:00-8:20<br>ආරම්භය: මැයි 7<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **සරත් ද සිල්වා** |

| | |
|---|---|
| **කිතුනු ආත්මිකතාව**<br>දෙවියන් වහන්සේ සමග සමීප සබඳතාවක් ඔබට ඇතිකර ගත හැක්කේ කෙසේද යන්න පැමිණ ඉගෙනගන්න. ඔබගේ හැකියාවන්, කාලය, පෞරුෂත්වය ඔබ ප්‍රයෝජනයට ගත යුතු ආකාරය දෙවියන් වහන්සේට අවශ්‍ය වන්නේ කෙසේද යන්න දැනගන්න. ඔබගේ මුළු හදවතින්, ශක්තියෙන්, ආත්මයෙන් හා ප්‍රාණයෙන් උන්වහන්සේට ප්‍රේම කරන්නේ කෙසේදැයි ඉගෙනගන්න. | **BTh\|Dip වෛකල්පික**<br>සති 13<br>දිනය: සිකුරාදා<br>වේලාව: ප.ව.6:00-8:20<br>ආරම්භය: මැයි 8<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **මිශෙල් පීරිස්** |

## 2 වන වාරය | 2026 මැයි 4 - අගෝස්තු 31
# සෙනසුරාදා පැවැත්වෙන පාඨමාලා
### පන්ති කාමරය තුළ

**බිඳුණු හදට සුවය**

BTh|Dip වෛකල්පික

චිත්තවේගී ප්‍රකම්පනය යනු සුවවීමට කාලය ගතවන හදවතේ සහ මනසේ තුවාලයකි. එය අපගේ සෑම කොටසකටම: අපගේ සම්බන්ධතා, අපගේ ශරීර, අපගේ සිතුවිලි සහ අපගේ ඇදහිල්ල යනාදියට වේදනා ඇති කරයි. මෙම පාඨමාලාවේ පරමාර්ථය වන්නේ වේදනාකාරී හා කම්පන සහගත අත්දැකීම්වල බලපෑම පිළිබඳ අවබෝධයක් ලබා දීම සහ මෙම වේදනාවෙන් සුවය ලැබීමට ආරක්ෂිත ස්ථානයක් ලබා දීම මෙන්ම එම සුවවීමේ ගමන හරහා අනෙක් පුද්ගලයන්ට මඟ පෙන්විය හැකි පහසුකම් සපයන්නන් බවට පත් කිරීමට නායකයන් සන්නද්ධ කිරීමයි.

සති 12

දිනය: සෙනසුරාද

වේලාව: පෙ.ව.9:00-11:30

ආරම්භය: මැයි 9

සම්මාන: 2

කථිකාචාර්ය: **පත්මසිලි ගුණතිලක**

## 2 වන වාරය | 2026 මැයි 4 - අගෝස්තු 31
# දේවධර්ම උපාධි සම්මන්ත්‍රණ
### පන්ති කාමරය තුළ

මෙම සම්මන්ත්‍රණ සකසා ඇත්තේ උපාධිය හෝ ශාස්ත්‍රපති වැඩසටහන්වලට ලියාපදිංචි වූ අය සඳහාය. පංති කාමරයක වැනි සැකැස්ම දේශනයක් හා සම්මන්ත්‍රණයක් අමතර සමබරතාවය ඇත. අමතර කියවීම් හා පර්යේෂණ මත පදනම්ව සිසුන් සාකච්ඡා සඳහා පත්‍රිකා සකස් කළ යුතුය.
උපාධි පාඨමාලාවේ ලියාපදිංචිය හා සම්මාන 60 සම්පූර්ණ කර තිබීම පූර්ව අවශ්‍යතාවන්ය.

**නායකත්වයේ ආකෘති**

BTh අනිවාර්ය

නායකත්වය විවිධාකාරය. විමුක්තිදායක සත්‍යය අවබෝධ කර ගන්න. දර්ශනික නායකයින්, කළමනාකරණ නායකයින්, එඬේර නායකයින්, කණ්ඩායම් ගොඩනඟන නායකයින් සහ ව්‍යාපාරික නායකයින් මෙයින් සමහරක් ය. ඔබ සතුව ඇති සුවිශේෂී නායකත්ව ස්වභාවය හඳුනාගන්නේ කෙසේද? ඔබගේ කණ්ඩායමට වෙනත් නායකයින් අවශ්‍ය ඇයි? තමන්ගේ සේවය ලබන්නවුන්ගේ යහපත වෙනුවෙන් විවිධ නායකයින් ක්‍රියා කරනුයේ කෙසේද?

සති 13

දිනය: අඟහරුවාද

වේලාව: පෙ.ව.9:00-ප.ව.12:30

ආරම්භය: මැයි 5

සම්මාන: 3

කථිකාචාර්ය: **රවින් කල්දේරා**

**2 වන වාරය | 2026 මැයි 4 - අගෝස්තු 31**

# දේවධර්ම උපාධි සම්මන්ත්‍රණ

## අන්තර්ජාලය හරහා

මෙම සම්මන්ත්‍රණ සකසා ඇත්තේ උපාධිය හෝ ශාස්ත්‍රපති වැඩසටහන්වලට ලියාපදිංචි වූ අය සඳහාය. පංති කාමරයක වැනි සැකැස්ම දේශනයක් හා සම්මන්ත්‍රණයක් අමතර සමබරතාවය ඇත. අමතර කියවීම් හා පර්යේෂණ මත පදනම්ව සිසුන් සාකච්ඡා සඳහා පත්‍රිකා සකස් කළ යුතුය.
උපාධි පාඨමාලාවේ ලියාපදිංචිය හා සම්මාන 60 සම්පූර්ණ කර තිබීම පූර්ව අවශ්‍යතාවන්ය.

| | |
|---|---|
| **සමකාලීන මතවාද**<br>මතවාද විසින් මිනිසා සිතන ආකාරයත් ජීවත්වන විධියත් බලවත් ලෙස නිර්ණය කරයි. ශුභාරංචිය අර්ථවත් ලෙස සන්නිවේදනය කිරීමට නම් මෙම නිර්ණායකයන්ගෙන් එල්ලවන අභියෝගය පිළිබඳ හොඳ අවබෝධයක් තිබිය යුතුය. | **BTh අනිවාර්ය**<br>සති 13<br>දිනය: සිකුරාද<br>වේලාව: පෙ.ව.9:00-ප.ව.12:30<br>ආරම්භය: මැයි 8<br>සම්මාන: 3<br>කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ \| මනෝජ් පීරිස්** |

# 3 වාරය

# 2026 අගෝස්තු 31 - නොවැම්බර් 28

○ පන්ති කාමරය තුළ | □ අන්තර්ජාලය හරහා | ★ මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

# කාල සටහන - 3 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| උදෑසන | ○ **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය II**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>ජී පී වී සෝමරත්න \|<br>මධු මිහිරි ප්‍රනාන්දු | ○ **සභා ආකෘති**<br>පෙ.ව.9:00-ප.ව.12:45<br>රවින් කල්දේරා<br>○ **කිතුනුවා කළමනාකරුවෙකු ලෙස**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>මහින්ද මුණසිංහ | ○ **පැරණි ගිවිසුම් පසුබිම**<br>පෙ.ව.9:00-ප.ව.12:20<br>චමිලා සුභාෂ් රණසිංහ<br>සහභාගිකමේ කාලය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ **දූතනය පිළිබඳ දේවධර්මය**<br>පෙ.ව.9:00-ප.ව.12:20<br>සනත් අතුකෝරාළ<br>දේව මෙහෙය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ **සේවය සඳහා ආචාරධර්ම**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>සරත් ද සිල්වා<br>○ **උපදේශනයට හැඳින්වීම**<br>පෙ.ව.9:00-පෙ.ව.11:20<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු |
| දහවල් | ○ **ඔබ තුළ ඇති නායකත්වය වර්ධනය කිරීම**<br>ප.ව.3:00-ප.ව.5:20<br>විමලසේන ජයලත් | ★ **දරුදැරියන් සඳහා ශ්‍රාවකත්වය**<br>ප.ව.3:00-ප.ව.5:30<br>ක්‍රිස්නි එදිරිසිංහ | ○ **සංස්කෘතිය, ජනවාර්ගිකත්වය සහ අනන්‍යතාවය**<br>ප.ව.3:00-ප.ව.5:20<br>ක්‍රිස්නි එදිරිසිංහ | ○ **කිතුනු සේවකයෙකුගේ ජීවිතය සහ කාර්යය**<br>ප.ව.3:00-ප.ව.5:20<br>දුලිප් ප්‍රනාන්දු | ○ **සංස්කෘතිය පිළිබඳ කිතුනු දෘෂ්ටියක්**<br>ප.ව.3:00-ප.ව.5:20<br>මධු මිහිරි ප්‍රනාන්දු |
| සවස | □ **බයිබලීය ආචාරධර්ම**<br>ප.ව.6:00-ප.ව.8:20<br>බර්නාඩ් කොස්තා | ★ **කණ්ඩායම් ගොඩ නගන්නෙකු වීම**<br>ප.ව.6:00-ප.ව.8:30<br>සරත් ද සිල්වා | ★ **විද්‍යාව සහ ඇදහිල්ල**<br>ප.ව.6:00-ප.ව.8:20<br>සනත් අතුකෝරාළ | ○ **දේවධර්මයට හැඳින්වීම**<br>ප.ව.6:00-ප.ව.8:20<br>ෂර්ලි ෆේබර් | □ **සියල්ලන්ටම ගැලපෙන අර්ථ විග්‍රහකිරීමේ උපකාරකයක්**<br>ප.ව.6:00-ප.ව.8:20<br>රවින් කල්දේරා |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

# 3 වන වාරය | 2026 අගෝස්තු 31 - නොවැම්බර් 28
# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## පන්ති කාමරය තුළ

### ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය II
*ප්‍රතිසංස්කරණයේ සිට 1900 දක්වා*

ප්‍රතිසංස්කරණ යුගයේ සිට (1517) නූතන ධර්මදූත ව්‍යාපාරය (1900) දක්වා කාලයේ බිහි වූ ශ්‍රේෂ්ඨ ප්‍රතිසංස්කරණවාදීන්, චතුර දේවධර්මවේදීන් සහ උත්සාහවන්ත ධර්මදූතයින්ගේ මුල පිරීමෙන් ලෝක ව්‍යාප්ත කිතුනු ප්‍රජාවක් ගොඩනැගේ. මෙම පාඨමාලාවෙන් ශතවර්ෂ හතරක සසුන් ඉතිහාසය වත්මන් කිතුනු සභාවට අදාළ වන්නේ කෙසේදැයි තේරුම් ගැනීමට උපකාරී වනු ඇත.

**BTh|Dip අනිවාර්ය**

සති 12

දිනය: සඳුදා

වේලාව: පෙ.ව.9:00-11:30

ආරම්භය: සැප්තැම්බර් 7

සම්මාන: 2

කථිකාචාර්ය: **ජී පී වී සෝමරත්න | මධූ මිහිරි ප්‍රනාන්දු**

### ඔබ තුළ ඇති නායකත්වය වර්ධනය කිරීම

සෑම කිතුනුවෙකුම කුමන හෝ මට්ටමේ නායකත්වයක් උසුලයි. නායකත්වය පිළිබඳ බයිබලීය ඉගැන්වීම් සහ සමාජ විද්‍යාවෙන් ලත් ආභාසය ඇතිව ගොඩනගන ලද මෙම පාඨමාලාව පහත සඳහන් දෑ ගවේෂණාත්මකව හදාරයි. නායකත්වයට දෙවියන් වහන්සේගේ කැඳවීම, දර්ශනය, නායකත්වයේ ප්‍රමුඛතාවන් හඳුනාගැනීම, තීරණ ගැනීම්, මිනිසුන්ගේ කෞශල්‍යතාවයන් වැඩි දියුණු කිරීම සහ ඒ සඳහා උපක්‍රම සැලසුම් කිරීම උගන්වනු ලැබේ.

**BTh|Dip වෛකල්පික**

සති 13

දිනය: සඳුදා

වේලාව: ප.ව.3:00-5:20

ආරම්භය: අගෝස්තු 31

සම්මාන: 2

කථිකාචාර්ය: **විමලසේන ජයලත්**

### කිතුනුවා කළමනාකරුවෙකු ලෙස

බයිබලීය මූලධර්මයන්ට අනුකූලව භෞතික සහ මානව සම්පත් ඵලදායි ලෙස සහ කාර්යක්ෂම ලෙස යොදා නියම ආකාරයට සංවිධානය කිරීමෙන් ආයතනික අරමුණු ඉටු කර ගත හැකිය. මනා කළමනාකාරිත්වයක් තුළ නිවසේ මෙන්ම සභාවේ ද උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට මෙම නියමයන් සහ සංකල්පයන් යොදා ගැනීමට උපකාරයකි.

**BTh|Dip වෛකල්පික**

සති 12

දිනය: අඟහරුවාදා

වේලාව: පෙ.ව.9:00-11:30

ආරම්භය: සැප්තැම්බර් 1

සම්මාන: 2

කථිකාචාර්ය: **මහින්ද මුණසිංහ**

### පැරණි ගිවිසුම් පසුබිම

පරණ ගිවිසුමේ පොත්වල සාරවත් හා වර්ණවත් පසුබිම මෙම පාඨමාලාවේදී පැහැදිලි කෙරේ. පුරාණ මැත පෙරදිග තිබූ සංස්කෘතිය, ආගම් හා එහි ඉතිහාසය ගවේෂණය තුළින් පරණ ගිවිසුම නව ආකාරයෙන් සජීවීව ඔබට දැකගත හැකිවනු ඇත.

**BTh|Dip අනිවාර්ය**

සති 13

දිනය: බදාදා

වේලාව: පෙ.ව.9:00-ප.ව.12:20

ආරම්භය: සැප්තැම්බර් 2

සම්මාන: 2

කථිකාචාර්ය: **චමිලා සුභාෂ් රණසිංහ**

**3 වන වාරය | 2026 අගෝස්තු 31 - නොවැම්බර් 28**

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

| | |
|---|---|
| **සංස්කෘතිය, ජනවාර්ගිකත්වය සහ අනන්‍යතාවය**<br>අපගේ අනන්‍යතාවය ගොඩනැගී ඇත්තේ ජනවාර්ගිකත්වය හා ස්ත්‍රී පුරුෂ භාවය ඇතුලු විවිධ අනන්‍යතා ලක්ෂණ එකතුවකිනි. සංස්කෘතිය හා අප පිළිබඳ අන් අයගේ ප්‍රකාශයන් අපගේ හැඩගැස්ම තීරණය කරන සාධකයන්ය. එම අනන්‍යතා ලක්ෂණ ඉගෙනගැනීම හා ක්‍රිස්තුන් වහන්සේ තුළ අපගේ අනන්‍යතාව අවබෝධ කරගැනීම මත අපට වෙනස් අය සමග ක්‍රියා කිරීමේ දී සිතිය යුත්තේ කෙසේදැයි මෙම පාඨමාලාව ගවේෂණය කරනු ඇත. | **BTh\|Dip අනිවාර්ය**<br>සති 13<br>දිනය: බදාදා<br>වේලාව: ප.ව.3:00-5:20<br>ආරම්භය: සැප්තැම්බර් 2<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **ක්‍රිස්නි එදිරිසිංහ** |
| **දූතනය පිළිබඳ දේවධර්මය**<br>දූතනය බයිබලය පුරා පැතිරී ඇති මාතෘකාවකි. ලෝකය පිළිබඳ දෙවියන් වහන්සේගේ කැමැත්ත උත්පත්ති 1 හි එළිදරව් කර ඇති අතර ලොවට ගැළවීම ගෙනෙන පොරොන්දුවක් උත්පත්ති 3 හි සඳහන් වී ඇත. ධර්මදූතනයේ තේමාව සොයා යෑමේදී ආබ්‍රහම්ගේ කැඳවීම, ඉශ්‍රායලයේ කැඳවීම, ජේසුස් වහන්සේගේ දූතනය, ක්‍රියා පොත මගින් ගෙනෙන දයකත්වය වැනි මාතෘකා මෙම පාඨමාලාවේදී හඳුරනු ලැබේ. | **BTh\|Dip වෛකල්පික**<br>සති 13<br>දිනය: බ්‍රහස්පතින්දා<br>වේලාව: පෙ.ව.9:00-ප.ව.12:20<br>ආරම්භය: සැප්තැම්බර් 3<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ** |
| **කිතුනු සේවකයෙකුගේ ජීවිතය සහ කාර්යය**<br>කිතුනු සේවකයෙකු වීමේ අද්විතීය කැඳවීම තේරුම් ගැනීමට උපකාරී වන විෂයකි. ප්‍රාදේශීය සභාවේ ද සමාජයේ ද උද්යෝගීමත්, බලවත් සේවකයෙකු විය හැක්කේ කෙසේද? නායකයෙකු ලෙස වර්ධනය වන අතරම, ආත්මික ජීවිතය ද ශක්තිමත් පවුල් සබඳතාවයක් ද තබා ගන්නා ආකාරය ඉගෙනීමට අවස්ථාව ලැබේ. | **BTh\|Dip වෛකල්පික**<br>සති 13<br>දිනය: බ්‍රහස්පතින්දා<br>වේලාව: ප.ව.3:00-5:20<br>ආරම්භය: සැප්තැම්බර් 3<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **දුලිප් ප්‍රනාන්දු** |
| **උපදේශනයට හැඳින්වීම**<br>මානසික සහ චිත්තවේගී සහනය අවශ්‍යව සිටින්නාවූ පුද්ගලයන් අපට දෛනික ජීවිතයේදී මුණ ගැසේ. ඔවුන්ට උපකාර කරන පුද්ගලයෙකු ලෙස කිතුනුවෙකු සවිගත වන්නේ කෙසේද? උපදේශනය පිළිබඳ බයිබලීය ඉගැන්වීම් හැදෑරීම, අන් අයට උපකාර කිරීම සහ ඔවුන් පූර්ණත්වයට පත්කිරීමට අවශ්‍ය මූලික කුසලතා සම්බන්ධයෙන් හැඳින්වීමක් සිදු කෙරේ. | **BTh\|Dip අනිවාර්ය**<br>සති 13<br>දිනය: සිකුරාදා<br>වේලාව: පෙ.ව.9:00-11:20<br>ආරම්භය: සැප්තැම්බර් 4<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **ඒන්ස්ටීන් ප්‍රනාන්දු** |

## 3 වන වාරය | 2026 අගෝස්තු 31 - නොවැම්බර් 28

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### පන්ති කාමරය තුළ

| සංස්කෘතිය පිළිබඳ කිතුනු දෘෂ්ටියක් | සති 13 **BTh\|Dip වෛකල්පික** |
|---|---|
| "සැබෑ ශ්‍රී ලාංකිකයකු වීම" සහ "සැබෑ කිතුනුවෙකු වීම" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික සංස්කෘතිය ලබ්ධියකට හෝ සාතන්ට අයත් දෙයක්ද? කිතුනු නොවන පොත්පත්, චිත්‍රපට සහ සංගීතය රසවිඳීමට කිතුනුවන්ට අවසර දිය හැකිද? ලෞකික බලපෑම්වලට විවෘත වීම අපගේ ආත්මවලට හානියක් ඇතිකරන්නේද? අපට සංස්කෘතියක් අවශ්‍ය වන්නේ ඇයි? සංස්කෘතියට හැඳින්වීමක් පාඨමාලාවෙන් මෙවැනි කරුණු පිළිබඳව සාකච්ඡා කෙරෙනු ඇත. | දිනය: සිකුරාද<br>වේලාව: ප.ව.3:00-5:20<br>ආරම්භය: සැප්තැම්බර් 4<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **මධු මිහිරි ප්‍රනාන්දු** |

## 3 වන වාරය | 2026 අගෝස්තු 31 - නොවැම්බර් 28

# දහවල් සහ සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

| දරුදැරියන් සඳහා ශ්‍රාවකත්වය | සති 12 **BTh\|Dip වෛකල්පික** |
|---|---|
| මහා පැවරීම මගින් සියලූදෙනා වෙත ධර්මදානය මෙන් ම, ශ්‍රාවකත්වය සඳහා පුහුණු කිරීමට කිතුනු අපට වගකීමක් ඇත. මා වෙතට දරුවන්ට පැමිණෙන්නට නොවළක්වන්නැයි ජේසුස් වහන්සේ පැවසූ සේක. ඒ හෙයින් දරුදැරියන් ජේසුස් වහන්සේ වෙතට පැමිණ උන් වහන්සේගේ භක්තිමත් ශ්‍රාවකයකු කරන්නේ කෙසේදැයි මෙම පාඨමාලාවෙන් හැදෑරීමට අවස්ථාවක් සැලසේ. | දිනය: අඟහරුවාද<br>වේලාව: ප.ව.3:00-5:30<br>ආරම්භය: සැප්තැම්බර් 1<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **ක්‍රිස්නි එදිරිසිංහ** |

| කණ්ඩායම් ගොඩ නගන්නෙකු වීම | සති 12 **BTh\|Dip වෛකල්පික** |
|---|---|
| ක්‍රිස්තියානි ප්‍රජාව සහ නායකත්වය සමගාමීව ගමන් කරයි. ප්‍රබල නායකයින් කණ්ඩායම් තුළ සිටීමෙන් එම සේවයේ දිගුකාලීන සාර්ථකත්වය තහවුරු වේ. උද්යෝගීමත් සේවක කණ්ඩායමක් ද නමස්කාර කණ්ඩායමක් ද දූත මෙහෙවර කණ්ඩායමක් ද ගොඩනැගීමත් සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගෙන සේවයේ ඉලක්ක ජය ගැනීමත් සහ කණ්ඩායමේ සාමාජිකයින් පරිණතභාවයට ගෙන ඒමටත් මෙයින් අවස්ථාව ලැබෙනු ඇත. | දිනය: අඟහරුවාද<br>වේලාව: ප.ව.6:00-8:30<br>ආරම්භය: සැප්තැම්බර් 1<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **සරත් ද සිල්වා** |

## 3 වන වාරය | 2026 අගෝස්තු 31 - නොවැම්බර් 28

# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

### විද්‍යාව සහ ඇදහිල්ල

BTh|Dip වෛකල්පික

විද්‍යාව මගින් ඇදහිල්ල අහකට දමා ඇද්ද? නොඑසේනම් ඒවා සම්පූර්ණ වෙනස් අත්දැකීම්ද? එසේත් නැතිනම් විද්‍යාව ඇදහිල්ල පාවිච්චි කරත්ද? මෙම පාඨමාලාව තුළදී ඉහත කී ප්‍රශ්න සාකච්ඡාවට භාජනය වේ. ඇතැම් ශ්‍රේෂ්ඨ කතුවරයින්ගේ ලියවිලි අධ්‍යයනය කිරීමෙන් විද්‍යාව සහ ඇදහිල්ල අතර සංවාදය තේරුම් ගැනීමට ශිෂ්‍යයා හට හැකියාව ලැබෙනු ඇත.

සති 13

දිනය: බදාදා

වේලාව: ප.ව.6:00-8:20

ආරම්භය: සැප්තැම්බර් 2

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

## 3 වන වාරය | 2026 අගෝස්තු 31 - නොවැම්බර් 28

# දහවල් සහ සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## අන්තර්ජාලය හරහා

### බයිබලීය ආචාරධර්ම

BTh|Dip අනිවාර්ය

බයිබලීය ඇදහිල්ල "දැහැමි දිවියක්" පිළිබඳව දැඩි අවධාරණයක් ඇති කරයි. සිනායි ගිවිසුම, දිවැසිවරුන්ගේ ලියවිලි, ප්‍රඥා සාහිත්‍ය, කන්ද උඩ දේශනාව යනාදියෙන් මතුවන ආචාරධර්මවල බලපෑම ද අලුත් ගිවිසුම් සභාවට ඒවා අදාළ කර ගන්නා ආකාරයද මෙම පාඨමාලාවෙන් විමර්ශනයට භාජනය කරනු ඇත.

සති 13

දිනය: සඳුදා

වේලාව: ප.ව.6:00-8:20

ආරම්භය: අගෝස්තු 31

සම්මාන: 2

කථිකාචාර්ය: **බර්නාඩ් කොස්තා**

### සියල්ලන්ටම ගැලපෙන අර්ථ විග්‍රහකිරීමේ උපකාරකයක්

BTh|Dip වෛකල්පික

බයිබලය පිළිබඳව පුදුමාකාර අන්තර් දැක්මක් ඇතැම් පුද්ගලයන්ට ඇත්තේ කෙසේදැයි ඔබ මවිත වුයේද? එය විජ්ජාවක් නොව පදගතාර්ථ සෙවීම හෙවත් අර්ථ විග්‍රහය නම් අමතර ක්‍රියාකාරකමක් කිරීමෙන් අත්පත්කරගත් දෙයකි. "අර්ථ විග්‍රහය" යන යම් ඡේදයක පැහැදිලි කිරීමක් හෝ අර්ථ නිරූපනයක් වේ. මෙම පාඨමාලාව සැලසුම් කර ඇත්තේ බයිබලය අධ්‍යයනය කිරීම සඳහා අවශ්‍ය මෙවලම් සහ මුලධර්මයන් ඔබට කියා දීමටත් පන්ති කාමරය තුළදීම ඒවා යොදාගනිමින් පුහුණුවේ යෙදීමටත් කාලය ලබා දෙමිනි.

සති 13

දිනය: සිකුරාදා

වේලාව: ප.ව.6:00-8:20

ආරම්භය: සැප්තැම්බර් 4

සම්මාන: 2

කථිකාචාර්ය: **රවින් කල්දේරා**

## 3 වන වාරය | 2026 අගෝස්තු 31 - නොවැම්බර් 28
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
### පන්ති කාමරය තුළ

| | |
|---|---|
| **දේවධර්මයට හැඳින්වීම**<br>අප අදහන දෙය ගැන පැහැදිලි දැනුමක් අපට තිබේද? අපගේ ඇදහිල්ල වෙනත් අයකුට පහදා දීමට ගොස් පැටලී නිරුත්තර වී තිබේද? දේවධර්මයට හැඳින්වීම විෂය ඉගෙනීමෙන් ඔබේ ඇදහිල්ල ඔබටම වඩා පැහැදිලි වන අතර අන් අයටත් ආත්ම විශ්වාසයෙන් යුක්තව පහදා දීමට හැකි මඟ පෑදීමක් කරයි. | **BTh\|Dip අනිවාර්ය**<br>සති 13<br>දිනය: බ්‍රහස්පතින්දා<br>වේලාව: ප.ව.6:00-8:20<br>ආරම්භය: සැප්තැම්බර් 3<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **ෂර්ලි ෆේබර්** |

## 3 වන වාරය | 2026 අගෝස්තු 31 - නොවැම්බර් 28
# දේවධර්ම උපාධි සම්මන්ත්‍රණ
### පන්ති කාමරය තුළ

මෙම සම්මන්ත්‍රණ සකසා ඇත්තේ උපාධිය හෝ ශාස්ත්‍රපති වැඩසටහන්වලට ලියාපදිංචි වූ අය සඳහාය. පංති කාමරයක වැනි සැකැස්ම දේශනයක් හා සම්මන්ත්‍රණයක් අමතර සම්බරතාවය ඇත. අමතර කියවීම් හා පර්යේෂණ මත පදනම්ව සිසුන් සාකච්ඡා සඳහා පත්‍රිකා සකස් කළ යුතුය.

උපාධි පාඨමාලාවේ ලියාපදිංචිය හා සම්මාන 60 සම්පූර්ණ කර තිබීම පූර්ව අවශ්‍යතාවන්ය.

| | |
|---|---|
| **සභා ආකෘති**<br>සෑම රටකම ඇති ක්‍රිස්තියානි සභාව ඔපවත්නේ එහි ඇති හරවත් විවිධවූ සම්ප්‍රදයන් නිසාය. මෙම පාඨමාලාව විවිධ ක්‍රිස්තියානි නිකායන්වල ආවේණික වූ සක්‍රමේන්තු, පොදු නමස්කාරය හා පරිපාලන සම්ප්‍රදයන්ගේ දේවධාර්මික හා ඓතිහාසික සම්භවය ගැන හැදෑරීමක් කරයි. විශ්ව සභාව තුළ ඇති විවිධත්වය අගය කිරීමට ශිෂ්‍යයා ඉගෙන ගනු ඇත. | **BTh අනිවාර්ය**<br>සති 12<br>දිනය: අඟහරුවාදා<br>වේලාව: පෙ.ව.9:00-ප.ව.12:45<br>ආරම්භය: සැප්තැම්බර් 1<br>සම්මාන: 3<br>කථිකාචාර්ය: **රවින් කල්දේරා** |
| **සේවය සඳහා ආචාරධර්ම**<br>මුදල්, කාමුකත්වය, බලය යන දේවල් හේතුකොටගෙන ක්‍රිස්තියානි සභාව තුළ බිඳ වැටීම් සහ තමා දැන කරන විෂම ක්‍රියා මෑත කාලයේ දක්නට තිබේ. මුදල්, කාමුක ආශාවන් සහ බලය නිසා සේවයේදී ඇතිවන සදාචාරාත්මක උපද්‍රවයන් පිළිබඳ දැනීමක් ලබාදීම මෙහි අරමුණය. මෙම කරුණුවලින් ඔබගේ සේවය ආරක්ෂා කරගැනීමට ක්‍රම සහ විධි ඇතිකරලීමටත් ඒවා ක්‍රියාවේ යෙදවීමටත් ඔබ විසින් උගෙන ගනු ඇත. | **BTh අනිවාර්ය**<br>සති 13<br>දිනය: සිකුරාදා<br>වේලාව: පෙ.ව.9:00-ප.ව.12:30<br>ආරම්භය: සැප්තැම්බර් 4<br>සම්මාන: 3<br>කථිකාචාර්ය: **සරත් ද සිල්වා** |

# උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

| පළමු වාරය | දෙවන වාරය | තුන්වන වාරය |
|---|---|---|
| **හිතෝපදේශ පොත**<br>ප.ව.5:15-ප.ව.8:00<br>නාමල් වීරසිංහ | **නායකත්වය**<br>ප.ව.5:30-ප.ව.8:00<br>සනත් අතුකෝරාළ | **නික්මයාමේ සිට ද්විතීය කථාව දක්වා**<br>ප.ව.5:40-ප.ව.8:00<br>ලසිත් රාජකරුණා |

### හිතෝපදේශ පොත

ජෝබ්, ධර්මදේශකයා සහ හිතෝපදේශ යන බයිබලීය පොත් පෞරාණික ඉශ්රායෙලයේ ප්‍රඥා සාහිත්‍ය සම්ප්‍රදාය ආරක්ෂා කරයි. මුළු පොතෙහි ඇති අන්තර්ගතය ගැන ගැඹුරු අවබෝධයකින් කියවන විට හිතෝපදේශ පොතේ ඇති පාඩම් ඇගයීමට ද ජීවිතයට අදාළ කර ගැනීමට ද හැකිවේ. ඉශ්රායෙල් ප්‍රඥාව තුළ ගිලෙන්න, ප්‍රඥාවන්ත ජීවිතයකට මඟ වූ හිතෝපදේශ පොත ඉගෙන ගන්න.

**BTh|Dip වෛකල්පික**

සති 11

දිනය: බදාදා

වේලාව: ප.ව.5:15-8:00

ආරම්භය: ජනවාරි 7

සම්මාන: 2

කථිකාචාර්ය: **නාමල් වීරසිංහ**

### නායකත්වය

***බයිබලයෙන් නායකත්වය ඉගෙනීම***

නායකත්වය පිළිබඳ විවිධ අදහස්වලින් සමාජය පිරී ඇත. කිතුනුවන් වන අප බයිබලයට අනුකූල නායකත්ව ප්‍රතිපත්ති ඉගෙන ගන්නේ කෙලෙසද? මෙම පාඨමාලාව ඔබගේ සේවය තුළ, රැකියා ස්ථානය තුළ, නිවස තුළ එලදායි ලෙස නායකත්වය දීමට මග පාදනු ඇත.

**BTh|Dip අනිවාර්ය**

සති 12

දිනය: බදාදා

වේලාව: ප.ව.5:30-8:00

ආරම්භය: මැයි 6

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

### නික්මයාමේ සිට ද්විතීය කථාව දක්වා

පුරාණ ඉශ්රායෙලයේ හැඩගැස්ම, මහත් පරිශ්‍රමය සහ ව්‍යවස්ථාව පිළිබඳ කරුණු ආවරණය වන පංච පුස්තකයේ විශාල කොටසක් අධ්‍යයනය කිරීමට මෙම පාඨමාලාවෙන් ඔබට අවස්ථාව ලබා දෙයි. එක් එක් පොතේ ආකෘතිය, එහි පණිවිඩය, ඉශ්රායෙල් සෙනඟට එය අදාළ වූයේ කෙසේද සහ එය අදට අදාළ කරගන්නේ කෙසේද යන්න ආවරණය කෙරේ.

**BTh|Dip වෛකල්පික**

සති 13

දිනය: බදාදා

වේලාව: ප.ව.5:40-8:00

ආරම්භය: සැප්තැම්බර් 2

සම්මාන: 2

කථිකාචාර්ය: **ලසිත් රාජකරුණා**


# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**විමලසේන ජයලත්,** BTh, LDD, MA
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. සිව්චතුරස්‍ර සභාවේ මධ්‍යම පළාතේ වැඩ බලන දේවගැතිවරයා ලෙස ද එම සභාවේ කමිටු සාමාජිකයෙකු හා කිතුනු අධ්‍යාපන අංශයේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස ද සේවය කරයි.



**ජී පී වී සෝමරත්න,** BA, MA (Missiology), MA (Theology), PgDip (Demography), PhD
***කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සම්මාන මහාචාර්යතුමාය.*** විපුල එලැති ගවේෂකයෙකු හා අධ්‍යාපනික පොත් සහ ලිපිවල කර්තෘවරයෙකි. මෙතුමා කොළඹ විශ්වවිද්‍යාලයේ නූතන ඉතිහාසය පිළිබඳ මහාචාර්ය ධුරය හෙබවූ අතර යෙරුසලමේ හෙබ්‍රෙව් විශ්වවිද්‍යාලයේ ට්‍රූමන් ආයතනයේ ද, ලී විශ්වවිද්‍යාලයේ සහ ෆුලර් දේවධර්ම ශාස්ත්‍රාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද සේවය කර ඇත. කාණ්ඩ හතකින් සමන්විත ශුද්ධ බයිබලයේ විශ්වකෝෂයේ කර්තෘවරයාය.



**ලසිත් රාජකරුණා,** BTh, MDiv
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු හා ගුරු මණ්ඩල සාමාජිකයෙකි. පිලිපීනයේ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL) බයිබලීය අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. යෞවන කිතුමග සංවිධානයේ ස්වේච්ඡා නායකයෙකු ලෙස අවරුදු 16ක්ද, පූර්ණකාලීන සේවකයෙකු ලෙස අවුරුදු 3ක් ද සේවය කර ඇත. මහනුවර බැප්ටිස්ට් සභාවේ ක්‍රියාශීලී සාමාජිකයෙක්ද, ඩීකන් මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද ක්‍රියා කර ඇත.




**ඊන්ස්ටින් ප්‍රනාන්දු,** HND (Counselling), BTh, PgDip (BAPC), MSW (candidate)
***කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සහකාර සම්බන්ධීකාරක: ප්‍රාදේශීය අධ්‍යයන වැඩසටහන.*** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. කිතුසෙවණ සේවයේ දේවගැතිවරයෙකු ලෙස ද ගෝලත්ව මධ්‍යස්ථානයේ ගුරුවරයෙක් හා උප විදුහල්පතිවරයෙක් ලෙස ද කටයුතු කර තිබේ. උපදේශන කටයුතුවල නිරත වන අතර ශ්‍රී ලංකා පදනම් ආයතනයෙන් උසස් ජාතික උපදේශන ඩිප්ලෝමාව ලබාගත්තේය.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**සුරංගික ප්‍රනාන්දු,** BTh, MA
හස්තාලේපනය ලද දේවගැතිවරයකු ලෙස ශ්‍රී ලංකා මෙතොදිස්ත සභාවේ වසර 25ක කාලයක් එවැන්ජලිස්ත මෙහෙවර මූලිකව විවිධ ආයතනයන්හි ඉගැන්වීමෙන්, ග්‍රන්ථ රචනයෙන් හා ක්‍රියාකාරීත්වයේ යෙදෙමින් මේ වන විට නුගේගොඩ සභාව භාර දේවගැතිතුමා ලෙස ක්‍රියාකරයි. මෙතෝදිස්ත දූත සේවා විදුහල් ඩිප්ලෝමාව සිට සෙරෙම්පූර් විශ්වවිද්‍යාලයේ මූලික උපාධිය සම්පූර්ණ කර, කැළණිය විශ්වවිද්‍යාලීය ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. කොරියාවේ මුග්වොන් විශ්වවිද්‍යාලය හා සභා වර්ධන මෙහෙවර වෙනුවෙන් ටෙලියෝ විශ්වවිද්‍යාලීය අත්දැකීමද ලබමින් ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ එවැන්ජලිස්ත දේවගැති පදවිය සඳහා වෙන්ව කැපවී ක්‍රියාකාරී වෙයි.



**දුලිප් ප්‍රනාන්දු,** BSc (Eng), BD, ThM
විශ්‍රාමික මෙතෝදිස්ත දේවගැතිවරයෙකි. මෙතුමා පේරාදෙනිය විශ්ව විද්‍යාලයේද ලන්ඩන් දේවධර්ම විද්‍යාලයේද (එක්සත් රාජධානිය) ෆුලර් දේවධර්ම ශාස්ත්‍රාලයේද (ඇමරිකාව) උපාධිධාරියෙකි. ඉංජිනේරු පසුබිමක් සහිත මෙතුමා කටුබැද්ද උසස් තාක්ෂණික විද්‍යාලයේද පසුව මොරටුව විශ්ව විද්‍යාලයේද දේශකයකු ලෙස කටයුතු කර ඇත. එතුමා ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ සභාපතිවරයෙකු ලෙසද කටයුතු කර ඇත.



**ක්‍රිස්නි එදිරිසිංහ,** BTh
***කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය.***
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. විසිවසරකට ආසන්නව ඉරුදින පාසල් හා පෙරපාසල් ගුරුවරියක් වශයෙන්ද අනතුරුව "ශ්‍රී ලංකා ළමා ධර්මදන සහභාගිත්වයේ" (CEF) මොරටු ශාඛාවේ අධ්‍යක්ෂිකාව ලෙසද සේවයකර ඇත.



**මධු මිහිරි ප්‍රනාන්දු,** Dip MME, BA, MA
කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරිණියකි. වසර විසි දෙකක් කොළඹ බිෂොප් විදුහලේ ගුරුවරියක් ලෙස සේවය කළ අතර උපදේශකවරියක් ලෙසද කටයුතු කරයි. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය නාලිකා හි වැඩසටහන් මෙහෙය වන්නියක් වන අතර කිතුනු ගුරු පුහුණු උපදේශකවරියක් ලෙසද සේවය කරයි. ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ ගිහි දේශිකාවකි.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර




**බර්නාඩ් කොස්තා,** BTh, MDiv, PhD (candidate)

ඉන්දියාවේ COTR දේවධර්ම ශාස්ත්‍රාලයේ පිලිපීනයේ IGSLහි උපාධිලාභියකි. ලංකා බයිබල් විද්‍යාලයේ උපාධි අධ්‍යයන මධ්‍යස්ථානයේ පීඨාධිපති ලෙස සේවය කළ ලංකාවේ විවිධ මට්ටම්වල සභා නායකත්වය ගොඩනැගීමෙන් සේවය කළේ ය. වර්තමානයේ International Graduate School of Leadership (IGSL) නායකත්වය පිළිබඳ කථිකාචාර්යවරුයකු ලෙස සේවය කරයි.




**සුරංග අතුකෝරාළ,** ADCN, DIM, BTh

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු වන අතර, හිටපු තොරතුරු තාක්ෂණ කළමනාකරු හා සහකාර පුස්තකාලයාධිපතිවරයාය. ජනතා දේවසභාවේ ප්‍රාදේශීය නායකයෙකු ලෙස සේවය කරන අතර පාලන මණ්ඩලයේ පරිපාලන කමිටුවේ සභාපති ධුරයද දරයි. එලෙසම දේව සභා සංගමයේ (එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්) අක්තපත්‍රධාරියෙක් වන හෙතෙම වර්තමානයේ ජීවිතාලෝකය හි උපදේශක/පරිපාලක සහ මානව සම්පත් කළමනාකරු වශයෙන්ද කටයුතු කරන්නේය. කිතු බැති ගී දැහැන සිංහල ගීතිකා කෝඩ් ඇප් හා වෙබ් සේවය මොහුගේ නිර්මාණයි.



**සනත් අතුකෝරාළ,** BSc, BTh, MA (Hons), PhD

***කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ශිෂ්‍ය කටයුතු සම්බන්ධීකාරකවරයාය.*** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරයෙකු වන මෙතුමා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජෛව විද්‍යාව පිළිබඳ උපාධියද, ටෝච් ට්‍රිනිටි විශ්වවිද්‍යාලයේ ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (2007) සහ අධ්‍යාපන අධ්‍යයනය පිළිබඳ ආචාර්ය උපාධිය (2020) ද ලබා ඇත. වසර 20 කටත් වැඩි දේව සේවයේ හා ඉගැන්වීමේ සේවයේ පළපුරුද්දක් ඇති අතර මෙතුමා සියලු ජාතීන්ගේ සභාවේ සාමාජිකයෙකි.



**සමන් පෙරේරා,** BTh, MTh

ශ්‍රී ලංකා ප්‍රෙස්බිටෙරියන් සභාවේ වත්මන් මහානායක තුමා වන අතර, ස්කොට්ලන්තයේ ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයේ දේවධර්මය පිළිබඳ උපාධිධාරියෙකි. ලංකා බයිබල් විද්‍යාලය, පේරාදෙණිය හා ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය, පිලිමතලාවහි දේවධර්මය පිළිබඳ කථිකාචාර්යවරයකු වශයෙන් ක්‍රියා කරයි. මහනුවර ප්‍රෙස්බිටෙරියන් සභාවේ (Scots Kirk) ප්‍රධාන දේවගැතිවරයා වශයෙන් කටයුතු කරන්නේ ය.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර




**සරත් ද සිල්වා,** BTh, MDiv
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දේවවේදි උපාධියද, නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL–Philippines) ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. වසර 30කට අධික කාලයක් පුරා විවිධ සේවා කෙෂ්ත්‍රවල පුළුල් අත්දැකීම් ඇති, වර්තමානයේ ඌව, නැගෙනහිර හා බස්නාහිර යන පළාත්හි බොහෝ පුරෝගාමි සේවකයින්ගේ මිත්‍රෝපදේශයෙකු (Mentor) ලෙස කටයුතු කරයි. තවද පීඩා විඳින සභාවන් වෙනුවෙන් සේවය කරන නිව් හාර්වෙස්ට් ෆවුන්ඩේෂන් ආයතනයේ ජාතික අධ්‍යක්ෂක වශයෙන් ද කටයුතු කරයි. ජීවමාන ක්‍රිස්තු සභාවේ දේවගැතිවරයෙකි.



**රවින් කල්දේරා,** DipAgri, BTh, BA , MA
***කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පීඨාධිපතිය.*** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ හා විවෘත විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකි. ඩලස් දේවධර්ම ශාස්ත්‍රාලයෙන් බයිබල් අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇති හෙතෙම අවුරුදු ගණනාවක පුරෝගාමී සභාරෝපණ සේවයේ අත්දැකීම් ඇත්තෙකි. පුරාතන මැදපෙරදිග හා බයිබලයේ භූගෝලය පිළිබඳ අවබෝධය නිසා ලංකාවේ ප්‍රකාශනයන්හි සිතියම් නිර්මාණය සඳහා සම්පත් දයකයකු ලෙස කටයුතු කොට ඇත. ජීවමාන ක්‍රිස්තු සභාවේ දේවගැතිවරයෙකි.




**මනෝජ් පීරිස්,** DipHTM, BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. මීගමුව ප්‍රදේශයේ පැල්පත්වාසී ජනතාව සමඟ සේවය කරන අතර Friends In Christ ගෝලත්ව සේවයෙහි පුරෝගාමී හා මිත්‍රෝපදේශක ලෙස කටයුතු කරයි. ජීවමාන ක්‍රිස්තු සභාවේ තරුණ සේවය භාර පාලකවරයා ලෙස ද ලංකා ප්‍රෙස්බිටේරියානු තරුණ ලීගයේ සම-සාමාජික (Co-Opt Member) ලෙස ද වගකීම් දරයි. සිංගප්පූරුව කවනන්ට් ප්‍රෙස්බිටේරියානු සභාවේ ශ්‍රී ලාංකීය සේවයෙහි ලාංකීය කලාපය භාර සභාපාලකවරයෙක් ලෙස ද කටයුතු කරයි.



**නාමල් වීරසිංහ,** BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. යෞවන කිතුමඟ සංවිධානයේ හි (YFC) වසර 24ක පූර්ණකාලීන සේවයේ නියැලි සිටින එතුමන් වර්තමානයේ තාරුණ්‍යය දිරිගැන්වීමේ සේවය භාරව කටයුතු කරනු ලබයි. උපදේශන කටයුතුවල නිරත වන අතර ඒ පිළිබඳ වැඩිදුර හදරයි. එතුමන් ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ ගිහි දේශකයකු ලෙසද කටයුතු කරයි.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**නිරෝෂන් පෙරේරා,** BTh, MTD
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. ජනතා දේව සභාව, එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්හි දේවගැතිවරයකු වන අතර Awake A Nation හි ජාතික අධ්‍යක්ෂකවරයා ද ලොවට පියෙක් අවශයයි ප්‍රගමනයේ ශ්‍රී ලංකාවේ කැඳවුම්කරු ද වේ. Global Impact සහ Habitat for Humanityහි පාලක මණ්ඩලයේ සේවය කරයි. ශ්‍රී ලංකාවේ එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ්හි උප සභාපතිවරයා ලෙස සේවය කරයි. එතුමාගේ දිගුකාලීන සේවා ජීවිතයේ ජනතා දේව සභාවේ තරුණ සේවය භාර සභාපාලකවරයා ලෙස ද සභා රෝපණය සහ සහන සේවාවල මෙන්ම උතුරු උගන්ඩාවේ ගුලුහි මිශනාරි සභා රෝපණය කිරීමේ සේවයේ නියැළී ඇත.



**මිශෙල් පීරිස්,** BTh, MA
***කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පූර්ණ කාලීන ගුරු මණ්ඩල සාමාජිකාවකි.*** ලංකා දේව සභාවේ (එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන්) බලපත්‍රලාභී දේවගැතිවරියක වන ඇය ජාතික මට්ටමින් තරුණ සේවය සඳහා විෂයමාලා සකස් කිරීමට සම්බන්ධ වී ඇත. ආසියා පැසිෆික් දේවධර්ම ශාස්ත්‍රාලයේ (APTS) සහ දකුණු ආසියා බයිබල් විද්‍යාලයේ (SABC) උපාධිධාරිනියකි. ඇය ශ්‍රී ලංකාවේ බයිබල් විද්‍යාලවල ප්‍රායෝගික දේවධර්මය සහ ඉතිහාසය පිළිබඳ පාඨමාලා ඉගැන්වීමේ බාහිර කථිකාචාර්යවරියක් ලෙස සේවය කර ඇත.



**පත්මසීලි ගුණතිලක,** BA, MA
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාව හා මානව විද්‍යාව පිළිබඳ විශේෂ උපාධි හැදෑරූ උපාධිධාරිනියක් වන අතර, පිලිපීනයේ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ ද උපාධිධාරිනියකි. ශ්‍රී ලංකා කැම්පස් කෲසේඩ් ආයතනයේ වසර 14ක කාලයක් ගෝලයන් ගොඩ නැගීම සහ නායකයන් පුහුණු කිරීමේ සේවය තුළ ද නිරතවිය. පූජක භාර්යාවක් ලෙස ද, සභාවේ දේශනා කිරීම ඇතුළු විවිධ සේවයන් වල ද නිරතවූවෙකි. ශ්‍රී ලංකා බයිබල් සංගමය සමග වසර 8ක පමණ කාලයක්; කම්පනයට පත් දරුවන්, නවයොවුන් දරුවන් හා වැඩිහිටියන් සුවපත් කිරීමේ ප්‍රධාන පහසුකම් සලස්සන්නෙක් ලෙස ද සේවය කර අත්දැකීම් ලැබුවෙකි. (Master Facilitator (HWOT) – 'Healing the Wounds of Trauma' for Children, Teenagers and Adults)

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**මහින්ද මුණසිංහ,** BTh, MA
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියකු වන අතර කැම්පස් කෘසේඩ් ෆොර් ක්‍රයිස්ට් සහ නැවිගේටර්ස් ආයතනයන් හි දිගු කලක් සේවය කර ඇත. පිලිපීනයේ ජාත්‍යන්තර නායකත්ව පිළිබඳ විද්‍යාලයේ (IGSL) පරිවර්තනාත්මක නායකත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි නායකයෙක් සහ පුර්ණ ගිහි දේශකයෙක් ලෙස සේවය කරන අතර වර්තමානයේ ගෝලයන් ගොඩනැගීමේ සේවාවේ නියුක්තව සිටි.



**චමිලා සුභාෂ් රණසිංහ,** HND (Counselling), BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. වසර 8ක කාලයක් සභාපාලිකාවක් ලෙස සේවයේ නිරතව සිටි අතර, පසුව ජීවිතාලෝක ආයතනයේ සිංහල සේවා කළමණාකාරිනිය වශයෙන්ද කටයුතු කරන ලදි. රූපවාහිනි සහ ගුවන්විදුලි කිතුනු වැඩසටහන් නිෂ්පාදිකාවක් සහ නිවේදිකාවක් වන අතර කිතුනු ලිපි හා පොත්පත් ලේඛිකාවක්ද වෙයි. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උපදේශනය පිළිබද ජාතික ඩිප්ලෝමාව ද (NDC) උසස් ජාතික ඩිප්ලෝමාව ද (HND) ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි දේශිකාවකි.



**ෂර්ලි ෆේබර්,** BTh
ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි රෙපරමාදු සභාවේ හසල අත්දැකීමක් ඇති දේවගැතිවරයකු මෙන් ම, වර්තමානයේ මහා නායකතුමන් ද වෙයි. ලංකා බයිබල් විද්‍යාලයේ උපාධිධාරියෙකි. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාලක මණ්ඩලයේ (හිටපු) සාමාජිකයෙකි.

# CTS පාඨමාලා විස්තර

ශිෂ්‍යයන් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා හැදෑරීම සඳහා සාදරයෙන් පිළිගන්නා අතර අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා අප ඔබ දිරිමත් කරන්නේ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වෙතින් ඔබට ලබාගත හැකි උපරිමය අත්කරගනු සඳහාය.

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය විසින් පෙළ හතරක අධ්‍යාපනයක් පිරිනමයි. ඒ සියල්ල ම ආසියානු දේවවේදී සංගමය (ATA) විසින් පිළිගනු ලැබූ ඒවා වේ. ඔබට වඩාත් ගැළපෙන්නේ කුමන පාඨමාලාවදැයි කියවා අනාවරණය කරගන්න.

**ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය (CCS)**
21 වැනි සියවසේ ජීවිතය, රැකියාව හා සේවය වෙනුවෙන් (ගිහි) කිතුනුවන් සවිගැන්වීම පිණිස මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 36කි*

**ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය: ළමා සේවා ක්ෂේත්‍රය (CCS-CM)**
සභාව සහ සමාජය සඳහා ඵලදායී ළමා සේවා සේවකයින් සන්නද්ධ කිරීමට නිර්මාණය කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 36කි*
*අන්තර්ජාලය හරහා ඉගැන්වේ*

**දේවධර්ම ඩිප්ලෝමා (DipTh)**
කිතුනු සේවකයන් සඳහා ගැඹුරු බයිබලීය අන්තර් දෘෂ්ටියක් හා සේවය සඳහා නිපුණත්වයක් ලබාදීම සඳහා මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 72කි*

**දේවධර්ම උපාධිය (BTh)**
සභා නායකත්වය (දේවගැති සේවය, ඉගැන්වීම සහ එවැනි සේවා) සඳහා කිතුනුවන් පුහුණු කිරීම සඳහා මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 108කි*

***වැඩි විස්තර/ සහය සඳහා විමසන්න:***
අධ්‍යයන කාර්යාලය
011 2890809; student.services@cts.lk; www.cts.lk

***උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානය:***
077 1415670; nc@cts.lk

# ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය
# ළමා සේවා ක්ෂේත්‍රය

**පාඨමාලාව:**

- පාඨමාලාවක් සාමාන්‍යයෙන් සතියකට දෙවරක් පැය 3ක කාලයක් පැවැත්වේ.
    - සෑම සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනකම ප.ව.6:00-9:00 දක්වා
- සෑම විෂයක් සඳහා සම්මාන පැය දෙකකි.
- වසර 2කින් ශිෂ්‍යයා හට මෙම විෂයමාලාව නිම කළ හැකිවන අයුරින් සැලසුම් කර ඇත.
- මෙම විෂයමාලාව 2026 ජනවාරි 5 දින ආරම්භ වේ.

| | විෂයන් | සම්මාන |
|---|---|---|
| අනිවාර්ය<br>බයිබලය සහ දේවධර්ම විෂයන්<br>ළමා සේවා විෂයන් | <br>04<br>04 | <br>08<br>08 |
| වෛකල්පික විෂයන් | 10 | 20 |
| සම්මන්ත්‍රණ | 04 | 00 |
| එකතුව | 22 | 36 |

සැ.යු.: සහතික පත්‍රය ලබාගැනීමට ඉහත සියලු විෂයන් සම්පූර්ණ කළ යුතු වේ.

**පාඨමාලා දේශන පැවැත්වීම:**

- **අන්තර්ජාලය හරහා:** පාඨමාලාව Zoom තාක්ෂණය හරහා ඉගැන්වෙන අතර අදාළ සටහන් Moodle පහසුකම තුළින් ලබා ගත හැකිය. ඔබට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවක් හා ඩිජිටල් උපාංගයක් අවශ්‍ය වනු ඇත.

**සන්නිවේදන තොරතුරු:**

ක්‍රිස්ති එදිරිසිංහ මිය
සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය
දුරකථන අංකය: +94 764823127
විද්‍යුත් තැපැල්: cm@cts.lk


BOOKSTORE
CTS ප්‍රකාශන
පළමු මහලේ පිහිටි
CTS පොත් හලට
පිවිසෙන්න
ඉතිහාසය විමසුමක්
ප්‍රබුද්ධත්වය සහ ක්‍රිස්තු සාසනය
1648-1789
ඔබේ දරුවාට සැබෑ ආදරය දැක්විය යුතු ආකාරය
බයිබලීය දේවධර්මය
බයිබලීය ධර්මනියාමකය
CTS පුස්තකාලය
පොත් 41,000 +
එකතුවක්
ඉංග්‍රීසි | සිංහල | දෙමළ
CTS පුස්තකාලය හා අදම සම්බන්ධ වන්න!
වැඩි විස්තර සඳහා
+ 94 112 890809 | library@cts.lk
CTS පුස්තකාලය සියලු සභාවන්ට විවෘතය

189 දුටුගැමුණු වීදිය, කොහුවල
(+94) 11 2890809 | student.services@cts.lk | www.cts.lk